# දිවයින



මුලා - ජුන්ඩා ඝාතනයකට පැමිණි අවස්ථාවක්



## මිනුවන්ගොඩ ඝාතනයකට පැමිණි

# පාතාලයේ ‘මුලා’ - ‘ජුන්ඩා’ එස්.ටී.එෆ්. වෙඩිකා මරුට







- එස්. ටී. එෆ්. නිලධාරියකුට තුවාල
- කුරුඳුවාඩියේ පිය පුතු ඝාතනයේ හා සැලොන් එකේ මිනී මැරුමේ සැකකරුවෝ
- ගිනි අවි සහ තියුණු ආයුධ සොයා ගැනේ
- වෙඩි කන්න කලින් වෙඩි තියලා

හේමන්ත රන්දුණු, ටෝනි කරුණානායක

මිනිස් ඝාතන ඇතුළු අපරාධ ගණනාවකට සම්බන්ධ පාතාල සාමාජිකයන් දෙදෙනකු මිනුවන්ගොඩ ජාපාලවත්ත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බළකාය එල්ල කළ වෙඩි ප්‍රහාරයකින් ඊයේ (18 දා) අලුයම මරුමුවට පත්වී ඇත. මෙම පාතාල මැරයන් දෙදෙනා ඌරගහ ඉන්දික නමැති පාතාල නායකයාගේ ගෝලයන් බව හඳුනාගෙන තිබේ. 02-පිටුවට

## මුදලිගේ හා සිරිධම්ම හිමි නිදහස් කරනු


ඡායාරූප - නිශාන් එස්. ප්‍රියන්ත





# අන්තරේ පා ගමනට කඳුළු ගෑස් ජල ප්‍රහාර

- විරෝධතාකරුවෝ පිරිසක් බස්වල නැගී පිටවෙති
- කඳුළු ගෑස් ගහලා අපිව වට්ටන්න බෑ

අන්තරේ වැඩ බලන කැඳවුම්කරු

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන්

රක්ෂිත බන්ධනාගාර ගතකර සිටින අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ සහ අන්තර් විශ්වවිද්‍යාලයීය භික්ෂු බලමණ්ඩලයේ කැඳවුම්කරු ගල්වැව සිරිධම්ම හිමියන් නිදහස් කරන ලෙස ඉල්ලා අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලය සංවිධානය කළ විරෝධතා පා ගමනට කොළඹ ස්ථාන කීපයකදීම පොලිසිය ජල සහ කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කරන්නට වීමත් සමග ඊයේ (18 දා) පස්වරුවේ උණුසුම් තත්ත්වයක් හට ගැනිණි. 02-පිටුවට



## අධ්‍යාපන අමාත්‍යාංශයට එච්. එස්. සරත් දුන් චිත්‍රය කවුරු හරි ගෙදර ගෙනිහින්

ජනපති කියයි

චමින්ද සිල්වා 02-පිටුවට

## අඩු බර පොහොර මිටි 14 ගැන විමර්ශනයක්

පැමිණිලි කරන්න දුරකථන 4ක්

අරුණ බෝගහවත්ත

02-පිටුවට

## බුද්ධි අංශ අන්දමන්ද කරමින් අන්තරේ විරෝධතාව පැවැත්වූවා

දුමින්ද නාගමුව



අනුරාධ හිරිපිටියගේ

බුද්ධි අංශ අන්දමන්ද කරමින් අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය විරෝධතාව ඉතාම සාර්ථකව පැවැත්වූ බව පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ප්‍රචාරක ලේකම් දුමින්ද නාගමුව මහතා ‘දිවයිනට’ ඊයේ පැවසීය. 02-පිටුවට



## වාහනය තාප්පයක ගැටේ

## ඉහළගම මාරක අනතුරින් මේජර් ඇතුළු තිදෙනෙක් මරුට දෙදෙනෙක් රෝහලේ

හේමන්ත රන්දුණු

ගල්ගමුව ඉහළගම ප්‍රදේශයේදී පෙරේදා (17 දා) රාත්‍රී සිදුවූ මාරක රිය අනතුරකින් යුද හමුදා මේජර්වරයකු ඇතුළු තිදෙනකු මියගොස් තවත් දෙදෙනකු බරපතළ තුවාල ලබා රෝහල් ගත කර ඇත. 02-පිටුවට

## නරක වෙලාවට නැති ප්‍රශ්න ඇති වෙනවා



පොලිස් නිලධාරිනියන්ගේ බෙල්ලෙන් ඇල්ලූ CI දිවයිනට කියයි

නෝමන් පලිහවඩන

02-පිටුවට

## විදේශ සේවයේ පුරප්පාඩුවලට 40ක් බඳවා ගන්නවා

විදේශ ඇමැති අලි සබ්රි

02-පිටුවට

## එහෙම ලිපියක් අපි යවා නැහැ

## සෙවනගල ලංකා සීනි සමාගම සුරැකීමේ සේවක සංගමය පුවත ගැන කරුණු පහදයි

02-පිටුවට

## පොහොර බෙදීම අවසන් වන තුරු නිවාඩු අවලංගු කරන්න

ඇමැති අමරවීර ඉල්ලයි

අරුණ බෝගහවත්ත 02-පිටුවට

## ඩයනාට එරෙහි පෙත්සම සලකා බැලීමට අභියාචනාධිකරණය තීරණය කරයි

ඒ. ජේ. ඒ. අබේනායක

රාජ්‍ය ඇමැතිනි ඩයනා ගමගේ මහත්මිය බ්‍රිතාන්‍ය පුරවැසියකු බවත් ඒ නිසා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක් දැරීමට නුසුදුසු තැනැත්තියක බවට නිගමනය කරන ලෙස හා ඇයට පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයේ කටයුතු කිරීම වළක්වන රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත් ඉල්ලා සමාජ ක්‍රියාකාරිකයකු වන ඕෂධ ලක්මාල් අනිල් හේරත් මහතා විසින් ගොනු කර ඇති රිට් ආඥා පෙත්සම සලකා බැලීම සඳහා ලබන 28 වැනිදා කැඳවීමට අභියාචනාධිකරණය ඊයේ (18දා) තීරණය කළේය. 02-පිටුවට

## ශෂී වීරවංශගේ නඩුවේ සාක්ෂි විභාගය පෙබරවාරි 24 දා

ඒ. ජේ. ඒ. අබේනායක 02-පිටුවට




★ පාසල් ළමුන්ගේ උපකරණ ගැන කතා කරනවට හරිනම් ළමයි අප්පුඩි ගහන්න ඕනෑ කියල කිරිඇල්ල කියන්නේ.....

★ මේ නාඩගම් කතා අහලා ළමයි හිනාවුණේ නැද්ද දන්නේ නැහැ....



## ලෝක මාර්ග අනතුරුවලට ලක්වූවන් අනුස්මරණ දිනය හෙට

ලෝක මාර්ග අනතුරුවලට ලක්වූවන් අනුස්මරණය කිරීමේ දිනය නොවැම්බර් 20 දිනට (හෙටට) යෙදී තිබේ. 02-පිටුවට

## ආයෝජකයන් දිරි ගන්වන සුළු නව පැකේජයක්

උපදේශක කාරක සභාව BOI වෙත උපදෙස් දෙයි

පවතින ආයෝජන පැකේජය ආයෝජකයන් ආකර්ෂණය කිරීමට ප්‍රමාණවත් නොවන බවත් මහ බැංකුව සහ භාණ්ඩාගාරයට කරුණු පැහැදිලි කොට ආයෝජකයන් දිරිගන්වන සුළු නව පැකේජයක් සැකසිය යුතු බවත් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව පසුගියදා ආයෝජන මණ්ඩලයට (BOI) උපදෙස් ලබා දුන්නේය. 02-පිටුවට

## ජාතික රෝහලේ-රිජ්වේ-කාසල් රුධිර පරීක්ෂණ රැසක් ඇනහිටී

චමින්ද සිල්වා සහ ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන් 02-පිටුවට

## නෙළුම් කුලුනේ ඉදිවන විනෝද කලාපයේ මුල්ම පියවරට ගිවිසුම් අත්සන් තබයි

02-පිටුවට


## කැලණියේ දුරුතු මහා පූජෝත්සවය



ජනවාරි 05 දා රාත්‍රී 8.30 ට මහ පෙරහැර

දිනපතා රාත්‍රී 7.00 සිට 8.00 දක්වා ධර්ම දේශනා

අද දින ධර්ම දේශකයාණන් වහන්සේ

පැපිලියාන සුනේත්‍රාදේවී මහා පිරිවෙන් විහාරාධිපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය,

ගරු මැදගොඩ අභයතිස්ස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

දායකත්වය

කැලණිය යටාලතිස්ස මාවතේ පදිංචි ඩබ්. සමරසිංහ මැතිනිය ඇතුළු දරු පිරිස විසින් පී. සමරසිංහ මැතිතුමා ඇතුළු ඥාතීන්ට පිං පිණිස

# නීති විරෝධී ජල සැපයුමකට ජාතික ජල සම්පාදනයේ බට ඇවිදගෙන ගිහින්...!

## සැකකරුවකු නැතුව ජල නළ උපාංග අත්අඩංගුවට



කරුණාරත්න ගමගේ

**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ජල නළ තොගයක් බකමූණ, ගඟේයාය, 503 කොටස ප්‍රදේශයේ පිහිටි වගා බිමක ජල සැපයුමක් සඳහා නීති විරෝධී ලෙස යොදාගෙන තිබියදී 16 දා අත්අඩංගුවට ගත් බව බකමූණ පොලිසිය කියයි.**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ වැටලීම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් සහ බකමූණ පොලිසිය එක්ව මෙම වැටලීම සිදුකර තිබේ.

ජල සම්පාදන මණ්ඩලයේ පොළොන්නරුව දිස්ත්‍රික්කය භාරව කටයුතු කරන ප්‍රධාන නිලධාරියකුගේ අනුදැනුමෙන් මණ්ඩලය සතු සම්පත් අවභාවිත කර මෙම නීති විරෝධී ක්‍රියාව සිදුකර තිබේ. ප්‍රධාන කාර්යාලයට ලැබුණු පැමිණිල්ලකට අනුව මණ්ඩලය සතු ජලනළ තොගය ඇතුලු උපාංග අත්අඩංගුවට ගැනීමට හැකිවූ බව වැටලීමට සම්බන්ධ වූ නිලධාරීහු පැවැසූහ. එම ජලනළ තොගයේ වටිනාකම කොපමණද යන්න මෙතෙක් තක්සේරුකර නැත. සැකකරුවකු අත්අඩංගුවට ගෙන නැත. මේ අතර මෙම ජලනළ යොදාගෙන ජලය ලබාගත් වගා බිම පිහිටි ඉඩම ජල සම්පාදන මණ්ඩලයේ පොළොන්නරුව දිස්ත්‍රික් ප්‍රධානියාට අයත් එකක්ද යන්නත් සොයා බලන බව එහි නිලධාරීහු ප්‍රකාශ කළහ.

ජාතික ජලාපවහන හා ජල සම්පාදන මණ්ඩලයේ විශේෂ වැටලීම් ඒකකයේ සහ අභ්‍යන්තර විගණන ඒකකයේ නිලධාරීහු ඒ පිළිබඳව පරීක්ෂණ පවත්වති. පොළොන්නරුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඉන්දිකද සිල්වා මහතාගේ උපදෙස් පරිදි බකමූණ පොලිසියේ ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක උපුල් බොලකඳුර මහතාගේ මෙහෙයවීමෙන් මේ පිළිබඳව පරීක්ෂණ පවත්වයි.

# රියැදුරු නොනාට නින්ද යෑමෙන් සුඛෝපභෝගී රථය ඇළට ගිහින්



ආර්. ඒ. එස්. ප්‍රේමතිලක - බණ්ඩාරගම සහ කැස්බෑව - ජයසිංහ

බණ්ඩාරගම සිට කළුතර දෙසට ගමන් කරමින් තිබූ සුඛෝපභෝගී මෝටර් රථයක් 17දා අලුයම ගෝනදූව ප්‍රදේශයේ දී ඉපිලිස්ස ඇළට පෙරළී ඇත. මෙහි ව්‍යාපාරික අඹු සැමි යුවළක් ගමන්ගෙන ඇති අතර, කාන්තාව මෝටර් රථය පදවා ඇති බවත් ඇයට නින්ද යෑමෙන් මාර්ගයෙන් ඉවතට පැන අනතුර සිදුව තිබේ. මෙම අනතුරෙන් කිසිවෙකුටත් හානි සිදුවී නැත.

# ඕකයි තත්ත්වේ



සල්ලි අච්චු ගැහුවේ වැඩිපුරම රටේ
නන්දලාල් අධිපති බව හැටට හැටේ
ගම්මන්පිල කියන විටදී ගහල ගැටේ
ටොෆියක් කබ්රාල් දැම්මා ඔහුගෙ කටේ

- අනුරාධ

# වරෙන්තු දෙකක් අතේ තියන්...

# වෙළෙඳ වෙස්ගෙන මත්ද්‍රව්‍ය ජාවාරම් කළ අයෙක් දැලේ

පින්සිරි ආරියරත්න රත්මලාන

**බන්ධනාගාරගතව සිටින ප්‍රධාන පෙළේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු වන 'වෙලේ සුදාගේ' සහෝදරයෙකු විදේශීය රටක නිෂ්පාදිත බෝර 12 බැරල් දෙකේ තුවක්කුවක් සමග ගෝනපොළ, කෝරලඉම ප්‍රදේශයේදී 17 වැනිදා දින ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය මගින් අත්අඩංගුවට ගෙන ඇත.**

අත්අඩංගුවට පත් සැකකරු ගෝනපොළ, කෝරලඉම ප්‍රදේශයේ පදිංචි 44 වන වියේ පසුවන්නෙකු බවද , වෙළෙඳාමේ නියුතු බවට අඟවමින් මෙම මත්ද්‍රව්‍ය ද්‍රව්‍ය ජාවාරම්වලට උදව් කරමින් සිට ඇති බවට අනාවරණයවී ඇත.

එසේම සැකකරු අයිස් මත්ද්‍රව්‍ය ජාවාරමේ නියුතු පුද්ගලයෙකු වශයෙන් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය මගින් අත්අඩංගුවට ගෙන ඇති පුද්ගලයෙකුද වන අතර දැනට ඔහුට එරෙහිව අධිකරණයේ වරෙන්තු දෙකක්ද නිකුත්කර තිබියදී සැඟව සිටි අයෙකුද වන බවත් පොලිසිය කියයි.

සැකකරුගෙන් සිදුකළ විමර්ශනයේදී රත්මලාන කාසියා මාවත බෝක්කුව අසල කසල ගොඩක සූක්ෂම ලෙස සඟවා තිබූ කෑලි දෙකට කැඩූ තුවක්කුව සමග එම උණ්ඩය පොලිස් භාරයට ගැනීමටද හැකිවී ඇතැයිදපොලිසිය කියයි.

මෙම වැටලීම ගල්කිස්ස කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මංගල දෙහිදෙනිය මහතාගේ ප්‍රධානත්වයෙන් ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ගමගේ නිලන්ත මහතාගේ සෘජු අධීක්ෂණය යටතේ උප පොලිස් පරීක්ෂක නීල් ප්‍රියන්ත, පොලිස් කොස්තාපල් වරු වන (40527) කුමාර, (93743) විජේසිංහ, (26454) රණසිංහ, පොලිස් කොස්තාපල් රියැදුරු (89863) රංගන යන නිලධාරීහු විසින් සිදුකරනු ලැබූහ.



අත්අඩංගුවට ගත් තුවක්කුව ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ගමගේ නිලන්ත මහතා ඇතුලු නිලධාරීන් පරීක්ෂාවට ලක් කරනු ලැබූ අයුරු.

# නිවසකින් සපත්තු කුට්ටමක් සොරකම් කළ ශිෂ්‍යයෙක් කූඩු

බඩල්කුඹුර රවිඳු ගුණතිලක

ඇතිමලේ පොලිස් වසමට අයත් කුඹුක්ගේයාය නිවසකට ඉකුත්දා ඇතුළුවූ පාසල් ශිෂ්‍යයකු නිවසේ තිබූ රුපියල් පන්දහසක් පමණ වටිනා සපත්තු ජෝඩුවක් සහ රුපියල් හාරසියයක් සොරාගෙන ගොස් ඇතැයි ඇතිමලේ පොලිසිය පවසයි.

නිවසේ හිමිකාරිය එදින උදෑසන දරුවන් ඒ අසල පදිංචි මවගේ නිවසේ තබා සියඹලාණ්ඩුව නගරයට වෙළෙඳාම් කටයුතු සඳහා ගොස් ඇත. සවස ආපසු පැමිණ බලන විටදී නිවසේ රෙදිපිළි ඇඳදමා ඇති බව දැක පරීක්ෂා කිරීමේදී නිවසේ තිබූ රුපියල් හාරසියයක් සහ රුපියල් පන්දහසක් පමණ වටිනා සපත්තු කුට්ටම තිබී නැත. ඒ පිළිබඳව ඇතිමලේ පොලිසියට පැමිණිලි කිරීමෙන් අනතුරුව පොලිස් නිලධාරීන් පැමිණ නිවසේ සවිකර තිබූ සීසීටීවී කැමරා පරීක්ෂා කිරීමේදී සොරකම අනාවරණයවී ඇත.

සොරකම සිදුකළ එම ප්‍රදේශයේම පදිංචි 16 හැවිරිදි පාසල් ශිෂ්‍යයකු පොලිසිය මගින් අත්අඩංගුවටගෙන ඇති අතර සොරකම්කරන ලද සපත්තු කුට්ටමද සොයාගෙන ඇත.

සැකකරු සහ නඩුභාණ්ඩ සියඹලාණ්ඩුව මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. ඇතිමලේ පොලිසියේ එම්. එම්. සංජය ධර්මදාස මහතා පරීක්ෂණ පවත්වයි.

# බිරිඳගේ නීත්‍යානුකූල සැමියා අනියම් සැමියාගේ දතක් ගලවයි

මිහින්තලේ රංග චතු

**පුද්ගලයෙකුට පහරදී දතක් කඩා දමා තුවාල සිදු කර ඔහුගේ ලොරි රථයට අනර්ථයක් සිදු කර පලා ගොස් සිටි තුවාලකරුගේ බිරිඳගේ අනියම් සැමියා බව කියන පුද්ගලයකු අත්අඩංගුවට ගත් බව ඉපලෝගම පොලිසිය පවසයි. මෙලෙස අත්අඩංගුවට පත්ව ඇත්තේ විජිතපුර, පලුගස්වැව, මුස්ලිම් කොළනියේ පදිංචි පුද්ගලයෙකි.**

තම බිරිඳ අනියම් ඇසුරක් පවත්වාගෙන යාම හේතුවෙන් සිත් තැවුලට පත්ව නිවෙසින් පිටව ගොස් සිට මීට දින කිහිපයකට පෙර, යළි නිවෙසට ගිය අවස්ථාවේ දී බිරිය නිවෙසේ දොර විවෘත නොකිරීම හේතුවෙන්, බැණ වැදී ජනේලයකට පහරදී නැවත පැමිණෙමින් සිටියදී පැමිණිලිකරු මෙම පහර කෑමට ලක්ව ඇතැයි සඳහන් කළේය. ඉපලෝගම පොලිස් වසමේ ඇලපෙරුමාගම හන්දියේදී තමන් ගමන් කළ ලොරි රථයේ මග හරස් කර නතර කළ සැකකරු ලොරි රථයයේ පැති කණ්ණාඩිය කඩා දමා තමාට පහර දී තුවාල සිදු කර උඩු ඇන්දේ දතක් කඩා දැමූ බව පැමිණිල්ලේ සඳහන්ව ඇතැයි පොලිසිය කියයි. ඉන් අනතුරුව පැමිණිලිකරු කලාවැව රෝහලට ඇතුළත් වී ප්‍රතිකාර ලබා ඇති. පුද්ගලයෙකුට පහරදී තුවාල සිදු කර අනර්ථයක් කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකරු අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි. ඉපලෝගම පොලිසියේ නිලධාරීන් පිරිසක් විමර්ශන මෙහෙයවා සැකකරු අත්අඩංගුවට ගැනීමට පියවර ගත්හ.

# විදෙස් රැකියා මවා රු. ලක්ෂ හැත්තෑවකට විදලා

## මුදල් ලබාගැනීමට අතරමැදියාගේ බිරිඳ හා දරුවන් සිරකළ පොලිස් සැරයන් ඇතුළු දෙදෙනා අත්අඩංගුවට

ආර්. ඒ. එස්. ප්‍රේමතිලක බණ්ඩාරගම සහ කැස්බෑව ජයසිංහ

**විදෙස් රටවල රැකියා සඳහා යවන බව පවසා ලක්ෂ 70 ක පමණ මුදලක් ලබාගෙන මගහැර සිටි පුද්ගලයකුගේ බිරිඳ සහ 7 සහ සිව් හැවිරිදි ඇයගේ කුඩා දරු දෙදෙනා බලහත්කාරයෙන් නිවසක සිරකර ගෙන සිටි පොලිසියේ සැරයන්වරයකු සහ ඔහුගේ බිරිඳ ඊයේ (18 දා) අලුයම අත්අඩංගුවට ගත් බව කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකය පවසයි.**

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ වැලිපැන්න පොලිසියේ සැරයන්වරයකු සහ ඔහුගේ බිරිඳ බව පොලිසිය කීය.

සැකකාර සැරයන්වරයාගේ බිරිඳ මතුගම සහ ඒ අවට ප්‍රදේශයේ තිස් පස් දෙනෙකුගෙන් විදේශ රැකියා සඳහා යවන බවට පොරොන්දුවී රුපියල් ලක්ෂ දෙක බැගින් ලක්ෂ 70 ක් පමණ එකතුකර නිකවැරටිය ප්‍රදේශයේ පුද්ගලයකුට ලබාදී තිබේ. මුදල් ලබාගත් පුද්ගලයා ඔවුන් මගහැර සිට ඇති බැවින් , සැරයන්වරයා ඉකුත් 4 දා ඔහු පැහැරගෙන විත් මතුගම නවුත්තුඩුව ප්‍රදේශයේ නිවසක සිරකර ගෙන සිට ඇතැයි පොලිසිය කීය. මුදල් ලබාදීම සඳහා තමා මුදවා හරින ලෙස අතරමැදියා ඉල්ලා සිට ඇති අතර, ඒ වෙනුවට ඔහුගේ බිරිඳ සහ කුඩා දරුවන් දෙදෙනා මතුගම ප්‍රදේශයට ගෙන්වාගෙන සිරකර ගෙන අතරමැදියා මුදාහැර ඇති බවද පොලිසිය කීය.

දරු දෙදෙනා සහ මව දින 6 ක් කටුගහහේන ප්‍රදේශයේ නිවස සිර කරගෙන සිටියදී මෙසේ සොයාගෙන සැකකාර සැරයන්වරයා සහ බිරිඳ අත්අඩංගුවට ගත්බව පොලිසිය කීය. මව සහ දරු දෙදෙනා කළුතර ශික්ෂණ රෝහලට ඇතුළත් කළ බව රෝහල් ප්‍රකාශයකයකු පැවසීය. සැකකරුවන් මතුගම මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කපිල ප්‍රේමදාස, සහකාර පොලිස් අධිකාරී ජගත් විජේසුන්දර සහ දුමින්ද රාජපක්ෂ යන මහත්වරුන්ගේ උපදෙස් පරිදි ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සනත් කුමාර මහතාගේ ප්‍රධානත්වයෙන් උප පොලිස් පරීක්ෂක නුවන් කෝරළගේ, සැරයන්වරුන්වන නිහාල් (13723), සුසිල් (45783, ඉන්දික (60015), කොස්තාපල්වරුන් වන ප්‍රියන්ත (79431), කුමාර (100360), කාන්තා දිව්‍යාංජලී (11281) සහ පො.කො.රි. තිලකරත්න (80621) වැටලීමට එක්වූහ.

# අනියම් බිරිඳගේ මුහුණ සපාකා දෙලක්ෂ අසූදාහක රන් බඩු ඉස්සූ පුද්ගලයා අත්අඩංගුවට

මිහින්තලේ රංග චතු

**අනියම් බිරිඳ සමග යතුරුපැදියකින් ගමන් කරමින් සිටියදී බලහත්කාරයෙන් එය නතර කරවා, ඇගේ මුහුණ සපා කා බෙල්ල සූරා, තුවාල සිදුකර ඇය සතුව තිබූ රුපියල් ලක්ෂ තුනකට ආසන්න රන්මාල තුනක්, පෙන්ඩන් තුනක් සහ ජංගම දුරකථනය රැගෙන පලාගිය අනියම් පුරුෂයා අත්අඩංගුවටගෙන තිබේ. සැකකරු කොල්ලකන ලද එම රන් භාණ්ඩ හා ජංගම දුරකතනය පොලිසිය විසින් සොයාගෙන තිබේ. තුවාල ලැබූ පැමිණිලිකාරිය විලච්චිය රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහලට මාරුකර යවා ඇත.**

මෙලෙස අත්අඩංගුවට පත්ව ඇත්තේ දකුණු ඉවුර, පේමඩුව ලිපිනයේ පදිංචි පුද්ගලයෙකි. තඹුත්තේගම ප්‍රදේශයේ පදිංචිව සිටින පැමිණිලිකාරිය පේමඩුව ප්‍රදේශයේ පදිංචි සැකකරු සමඟ මීට මාස දහයකට පමණ පෙර සිට අනියම් සබඳතාවක් පවත්වා ගෙන ගොස් ඇත. මේ අතරවාරයේදී අනුරාධපුර උසාවියේ පැවති නඩු කටයුත්තක් සඳහා සහභාගී වී නැවත ආපසු යමින් සිටියදී මෙම කොල්ලකෑම සහ තුවාල කිරීම සිදුව ඇති බව පොලිසිය කියයි.

විලච්චිය වැවේ ගිනි පෙට්ටි පාලම අසලදී පසුපැදිකරු ලෙස ගමන් කළ අනියම් සැමියා තමාට යතුරුපැදිය නතර කරන ලෙසට පවසා තිබේ. එහිදී සැකකරු එක්වරම තමාගේ මුහුණ සපා දමා බෙල්ල සූරා තුවාල සිදු කර දෙලක්ෂ අසූදාහක් වටිනා රන්මාල තුනක්, පෙන්ඩන් තුනක් සහ ජංගම දුරකතනය රැගෙන පලාගිය බවත්, පැමිණිලිකාරිය ප්‍රකාශවල සටහන් ඇතැයි පොලිසිය සඳහන් කළේය. මහවිලච්චිය පොලිස් ස්ථානාධිපති ඩබ්ලිව්. එම්. මලලසේකර මහතාගේ උපදෙස් මත පොලිස් නිලධාරීන් පිරිසක් විමර්ශන මෙහෙයවා සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

# බගවන්තලාවේ රක්ෂිතය තුළ කසිප්පු පෙරූ දෙදෙනෙක් ගෝඩා සමග දැලේ

නුවරඑළිය නාලක රත්නායක

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන බගවන්තලාව සමනල ස්වාභාවික රක්ෂිතය තුළ නීති විරෝධී ලෙස මත්පැන් පෙරමින් සිටි සැකකරුවන් දෙදෙනකු බගවන්තලාව පොලිසිය විසින් (18 දා) අත්අඩංගුවට ගෙන ඇත.**

රක්ෂිතය තුළ පිරිසක් නීති විරෝධී මත්පැන් පෙරණ බවට ලද තොරතුරක් මත බගවන්තලාව පොලිසියේ නිලධාරීන් රක්ෂිතය තුළ මෙහෙයුමක් දියත්කර සැකකරුවන් දෙදෙනා සහ මත්පැන් පෙරීමට උපයෝගි කරගත් උපකරණ රැසක් පොලිස් භාරයට ගෙන ඇත.

සැකකරුවන් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ මත්පැන් පෙරමින් සිට තිබේ. සැකකරුවන් විසින් පෙරා තිබූ නීති විරෝධී මත්පැන් ස්ප්‍රිතු ලීටර් 10 ක් පොලිස් භාරයට ගෙන ගෝඩා ලීටර් 200 ක් විනාශ කළ බවද වැටලීම සිදු කළ බගවන්තලාව පොලිසියේ නිලධාරීහු පැවසූහ.

අත්අඩංගුවට ගත් සැකකරුවෝ බලංගොඩ, මාරතැන්න ප්‍රදේශයේ පදිංචි අවු 40 සහ 45 වයස් කාණ්ඩවල පසුවන අය වෙති. අත්අඩංගුවට ගත් සැකකරුවන් හැටන් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

# බඩෝවිට ආගන්තුක මෙහෙයුමෙන් නමගිය අපරාධකරුවන් ඇතුළු 23 ක් මාට්ටු

කැස්බෑව බිමල් ජයසිංහ

**ගල්කිස්ස බඩෝවිට ප්‍රදේශයේ සිදුකළ 'ආගන්තුක මෙහෙයුමේදී' විවෘත වරෙන්තු ලද පුද්ගලයන් නවදෙනකු ඇතුළු 23දෙනකු අත්අඩංගුවට ගත් බව බස්නාහිර පළාත දකුණු දිසාව අපරාධ කොට්ඨාසය කියයි. වරෙන්තු මත අත්අඩංගුවට ගත් නවදෙනා අතර කාන්තාවන් දෙදෙනෙක්ද වන බව පොලිසිය කියයි.**

සංවිධානාත්මක අපරාධකරුවන්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, විවිධ අපරාධවලට සම්බන්ධ වූවන් සහ වරෙන්තුකරුවන් රැසක් බඩෝවිට තුන්වැනි සහ හයවැනි අදියර නිවාසවල සැඟව සිටින බවට බස්නාහිර පළාත (අපරාධ භාර) නියෝජ්‍ය පොලිස්පති ප්‍රශාන්ත ජයකොඩි මහතාට ලද තොරතුරකට අනුව එම ප්‍රදේශවල පැය හතරක් පුරා සිදුකළ මෙහෙයුමේදී සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට හැකි වී තිබිණි. අළුයම 5 සිට පෙරවරු නවය දක්වා මෙම මෙහෙයුම සිදු කෙරිණි.

පොලිස් නිලධාරීන් 42කගෙන් යුත් පිරිසක් කණ්ඩායම් හතරකට බෙදී නිවාස හතළිහක් පමණ පරීක්ෂා කිරීමෙන් අනතුරුව සැකකරුවන් පිරිස අත්අඩංගුවට ගත් බව පොලිසිය කියයි. බස්නාහිර පළාත් අපරාධ භාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රශාන්ත ජයකොඩි මහතාගේ අධීක්ෂණය යටතේ බස්නාහිර පළාත දකුණු දිසාව අපරාධ කොට්ඨාසයේ අධ්‍යක්ෂක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ලලිත් අබේසේකර, නියෝජ්‍ය අධ්‍යක්ෂ සහකාර පොලිස් රොහාන් පෙරේරා, සහකාර පොලිස් අධිකාරි චන්දන ගමගේ යන මහත්වරුන්ගේ මෙහෙයවීමෙන් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ජයන්ත පෙරේරා මහතාගේ මඟපෙන්වීම මත පොලිස් පරීක්ෂක හේමන්ත කුමාර, සුමිත් ජයසිංහ ඇතුළු නිලධාරීන් රැසක් වැටලීමට එක්වූහ.

# තුන් නිවුන් සිඟිත්තියන් ජීවත් කරවන්න දෙමාපියෝ ඔබේ ආධාර පතති

නුවරඑළිය නාලක රත්නායක

**මස්කෙලිය බ්‍රවුන්ස්වික් වතුයායේ කුයින්ස්බෙරි කොටසේ වතු කම්කරු පවුලකට දාව අලුත උපන් තුන් නිවුන් සිඟිත්තියන් තිදෙනා හදාවඩා ගැනීමට සහ පෝෂණය කිරීමට උපකාර කරන ලෙස එම සිඟිත්තියන්ගේ මව සහ පියා ජනතාවගෙන් ඉල්ලා සිටිති.**

සිඟිත්තියන්ගේ පියා වන තිරුමන් ක්‍රිෂ්ණ කුමාර් (40) එම වතු යායේ වතු කම්කරුවකු වශයෙන් සේවය කරන අතර සිඟිත්තයන්ගේ මව රත්නපාක්‍යන් ලෙච්චුමි (38) යන අයයි.

තම බිරිඳ ගැබිණියක්ව සිටියදී දික්ඔය මූලික රෝහලේ සායන කටයුතු සඳහා ගිය අවස්ථාවේ තම බිරිඳට දරුවන් තිදෙනෙකු ලැබීමට සිටින බව ස්කෑන් පරීක්ෂාවේදී තහවුරු වූ බව පැවසීය. එම දරුවන්ගේ වර්ධනය අඩු නිසා බිරිඳව නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහල වෙත යොමු කිරීමෙන් පසු කුසේ සිටි දරුවන් තිදෙනා වර්ධනය වන තෙක් මාස තුනක කාලයක් එම රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලැබූ බව තිරුමන් ක්‍රිෂ්ණ කුමාර් කියා සිටියේය. මේ මස (01) දින නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහලේ වෛද්‍යවරුන් සිසේරියන් සැත්කමකින් සිඟිත්තියන් තිදෙනා ලබාගත් බවත්, ඉන් පළමු සිඟිත්තිය ක්‍රිෂ්ණරුබනි උදෑසන 11.39ට, දෙවන සිඟිත්තිය ක්‍රිෂ්ණන් ක්‍රිෂාණි උදෑසන 11.40 ට, තුන්වන සිඟිත්තිය ක්‍රිෂ්ණන් ලොෂනි උදෑසන 11.41 ට මෙලොවට බිහි කළ බව තිරුමන් ක්‍රිෂ්ණ කුමාර් කියා සිටියේය. දැනට දින 18 පමණ වයසැති සිඟිත්තියන් තිදෙනාට මව් කිරි පමණක් ලබාදෙන බවත්, තමන්ට පාසල් වයසේ පසුවන අවු 10 සහ අවු 8 පුතුන් දෙදෙනෙකුද සිටින බවත්, තම මවද රැකබලා ගැනීමට තමන්ට සිදු වී ඇති නිසා එම සියළු දෙනා ජීවත් කරවීමට තමන් ලබා ගන්නා වැටුප ප්‍රමාණවත් නොවන බව තිරුමන් ක්‍රිෂ්ණ කුමාර් කියා සිටියේය.

තවද අලුත උපන් සිඟිත්තියන් තිදෙනාට මව් කිරි පමණක් දැනට ලබාදෙන ලෙසට වෛද්‍යවරුන් උපදෙස් ලබා දුන්නද තම බිරිදට අවශ්‍ය ගුණාත්මක ආහාරපාන සහ පෝෂ පදාර්ථ ලබාදීමට තමන්ට අදායම් තත්ත්වයක් නොමැති බව ඔහු කීය.

තම නිවසට යාබදව පිහිටි අසල්වාසින්ට හැකි අයුරින් තම පවුල රැකබලා ගැනිමට උපකාර කරන බවත්, තම නිවසේ එකම පවුලේ තිදෙනෙකු ජීවත් වන බවත්, එම සියළු දෙනාම වෙන් වෙන් වශයෙන් එම නිවසේ පදිංචිව සිටී. තේ වත්තේ වැඩ කර තමන්ට ලැබෙන ඉතා සොච්චම් වැටුපෙන් තම පවුලේ සාමාජිකයන් 07 දෙනකු සහ තම මවට ජීවත් වීමට ප්‍රමාණවත් අදායම් තත්ත්වයක් නොමැති නිසා අලුත උපන් සිඟිත්තියන් තිදෙනා පෝෂණය කිරීමට ආධාර උපකාර කරන්නැයි ඔහු ඉල්ලා සිටියි. තිරුමන් ක්‍රිෂ්ණ කුමාර්ගේ 0762919199 කතාකර වැඩිදුර විස්තර ලබාගත හැක.

දිවයින
2022 නොවැම්බර් මස 19 වැනිදා සෙනසුරාදා
අංකඃ 223, බිලුමැන්ඩල් පාර, කොළඹ 13.
කර්තෘ මණ්ඩලය - 2448402, 2497500
ෆැක්ස් - 2344253, 2438750

වෙබ් අඩවිය - www.divaina.com
ඊමේල් - divaina@unl.upali.lk
divainapro@unl.upali.lk

www.facebook.com/divainanewspaper

දැන්වීම් අංශය - 2434190 (ප්‍රධාන කාර්යාලය)
ෆැක්ස් - 2344252, 2330024

බෙදාහැරීම් අංශය - 2497568, 2497519, 2497580
ෆැක්ස් - 2334564
කොටුව කාර්යාලය - 011 2334565

## ඊළඟ කට්ටිය යෑමට පෙර

තව දින කිහිපයකින් විශ්‍රාම යෑමට නියමිත සෞඛ්‍ය අමාත්‍යාංශයේ උසස් නිලධාරීන් පිරිසක් පුහුණුවීම් සඳහා යැයි කියමින් අමාත්‍යාංශයේ සහ එන්ජීඕ කිහිපයක වියදමින් පිටරට ගොස් පැමිණ ඇත. මෙසේ සංචාරය කළ නිලධාරීන් ගණන 11 කි. පසුගිය මාස 2 ක කාලය තුළ යුරෝපය, ඉන්දියාව, සිංගප්පූරුව ඇතුළු රටවල් ගණනාවක ඔවුන් සංචාරය කර තිබේ. එයට ඇමැතිවරයාගේ අනුමැතිය පවා ලැබී නැත.

මෙහිදී වැදගත් ප්‍රශ්න කිහිපයක් පැනනගී. මේ ගමනට ඇමැතිගේ අනුමැතිය නොලැබුණේ නම් එම අනුමැතිය දෙන ලද්දේ කවර නිලධාරියකු විසින් ද? ඒ බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් දන්නවාද? රාජ්‍ය නොවන සංවිධානයක් වෙතින් රජයේ නිලධාරීන් සඳහා මුදලක් ලබා ගන්නා විට ඒ වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතාවන් බොහෝමයක් තිබේ. එයින් පළමුවැන්න වන්නේ මෙසේ මුදල් එවන රාජ්‍ය නොවන සංවිධානය කවර ප්‍රමිතියකට අයත් ආයතනයක් ද යන්නය. සමහර විට එම රාජ්‍ය නොවන සංවිධානය බෙදුම්වාදයට උදව් කරන සංවිධානයක් විය හැකිය. නො එසේ නම් එම සංවිධානය කිසියම් ආගමක් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර මට්ටමෙන් ක්‍රියාකාරී වී එම ආගම සඳහා මිනිසුන් නම්මවා ගැනීමට මුදල් වියදම් කරන සංවිධානයක් විය හැකිය. එහෙමත් නැත්නම් එම සංවිධානය කළු සල්ලි සුදු කරන සංවිධානයක් විය හැකිය. එන්ජීඕ එකකින් ආණ්ඩුවේ වැඩකට FUND කරන විට ඒ සම්බන්ධයෙන් සොයා බලන විශාල පිරිසක් සිටිති. උදාහරණයක් වශයෙන් නාසිවාදය ප්‍රවර්ධනය කරන සංවිධානයක් මේ රටේ දේශපාලනඥයන්ට වැඩමුළු පැවැත්වීමට සල්ලි වියදම් කළහොත් එතැන විශාල චර්යාත්මක ප්‍රශ්නයක් හට ගනී. ඒ නිසා ආණ්ඩුව එවැනි සංවිධානයක් රටේ හතර මායිමකට වද්දා ගන්නේ නැත. කිසියම් රටක සන්නද්ධ ගැටුම් සඳහා සහ ත්‍රස්තවාදය සඳහා උදව් කරන සංවිධානයක් ශ්‍රී ලංකා යුද හමුදාවට පුහුණු සැසියක් පවත්වන්නට ගියහොත් එය ද අවුලක් බවට පත්වේ. එහිදී එම වැඩේට ආණ්ඩුව ඉඩ දෙන්නේ නැත. එහෙත් ඉහත සඳහන් රාජ්‍ය නොවන සංවිධාන සහ සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන්ට සියලු දෙනාගේම ඇස් වසා ගේම ගැසීමට හැකි වී තිබේ.

පසුගිය මාස 03 කට පෙර ශ්‍රී ලංකාව පැවතියේ ඉතාම නරක අරගලකාරී තැනක ය. එමෙන්ම ඉතාම නරක දේශපාලන නොසන්සුන්තාවක් රට තුළ පැවතිණ. අපගේ අදහස වන්නේ මෙම අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ කපටි රැළ විශ්‍රාම කාලයේදී සෞඛ්‍ය සේවා සැපයීම පුහුණුවීම සඳහා ඉහත සඳහන් සංචාරවල නිරත වූ බව ය. රජයේ රෙගුලාසි කඩමින් මෙවැනි දේ කරන නිලධාරීන්ට විරුද්ධව පියවර ගැනීමේ හැකියාව ආණ්ඩුවට තිබේ. අප බොහෝ දෙනා දන්නා පරිදි ඇතැම් රාජ්‍ය නිලධාරීන් විශ්‍රාම යෑමෙන් පසුවද තමන් කළ දූෂණ සහ වංචා සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටී. ඉහත සඳහන් වංචනික ක්‍රියාව ආණ්ඩුවේ වරදක් නොව නිලධාරීන්ගේ හොරකමක් බව අපගේ මතය වේ. එබැවින් අනාගතයේදීත් මෙවැනි දෑ සිදු නොවනු පිණිස වැඩපිළිවෙළක් යෙදීම ආණ්ඩුවේ වගකීම බව අප විශ්වාස කරමු.

ඉහත සඳහන් නිලධාරීන් විසින් පුහුණු සැසිවාරය සඳහා ගිය ගමන තරුණ පරම්පරාවට අයිති ගමනකි. පුහුණුව යනු සක්‍රිය මෙහෙයුම්වල යෙදී සිටින අයගේ අයිතිවාසිකමක් බව පෙන්වාදිය යුතුව තිබේ. හෙට විශ්‍රාම යන එකාට අද ලබාදෙන පුහුණුව අනිද්දාට වතුරේ යයි. ඊට හේතුව හෙට විශ්‍රාම ගන්නා එකා අනිද්දා සිට ගෙදරට වී සිටීමය. එහෙත් ඔහුට තම ක්ෂේත්‍රයේම වෙනත් වෘත්තියක් ලබා ගැනීමට හැකි වුණොත් එමගින් විශාල මෙහෙවරක් කිරීමට හැකි වේ. එහෙත් ලංකාව වැනි රටවල එවැනි අවස්ථා විරල ය. එක්කෝ එවැනි අවස්ථා ඇත්තේම නැත. සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් රැළ පිළිබඳ සිද්ධිය පාඩමකට ගැනීම රජයේ වගකීම වේ. ඊළඟ විශ්‍රාමාපේක්ෂිතයන් පිරිස පුහුණුව සඳහා යෑමට පෙර සැලකිලිමත් වීමට රජය වගබලා ගත යුතුය.



# ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ඉන්දියාවේ සහ චීනයේ භූමිකාව

**ආචාර්ය තිස්ස ගුණවර්ධන**

ශ්‍රී ලංකාව මෑත ඉතිහාසයේ මුහුණ දෙන දරුණුතම මූල්‍ය අර්බුදයෙන් මිදීමට අපේක්ෂා කරන බැවින් ලබා ගත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමට ජපානය, ඉන්දියාව සහ චීනය ඇතුළු ණය ලබා දුන් පාර්ශ්වයන් සමග මේ වන විට ඵලදායී ලෙසට සාකච්ඡා පවත්වාගෙන යන බව රජයේ පාර්ශ්වය අවධාරණය කර සිටියි.

මිලියන 22 ක ජනගහනයක් වෙසෙන රටේ ජනතාවගේ ඉන්ධන, ආහාර, ගෘහස්ථ ගෑස් සහ ඖෂධ ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සඳහා ගෙවීමට ඩොලර් සපයා ගැනීම දෛනිකව අභියෝගයක්ව පවතී. එම භාණ්ඩ ප්‍රවාහන නැව් සමාගම්වලට දෛනිකව ප්‍රමාද ගාස්තු ගෙවමින් සිටින අතර එයින් මෙම අර්බුදයේ අවසානයක් තවම පේන මානයක නොමැති බව වටහා ගත හැකිය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් යෝජනා කරන ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට අදාළව ණය හිමියන් සමග මේ වන විට ඵලදායි සාකච්ඡා ආරම්භ කිරීමට අවශ්‍ය පසුබිම සකසා ඇති බව මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා මෑතකදී ප්‍රකාශ කර තිබුණි.

ශ්‍රී ලංකාව පළමු වරට විදේශ ණය පැහැර හැරීම සිදු කළේ මැයි මාසයේදීය. ජපානය, ඉන්දියාව සහ චීනය ශ්‍රී ලංකාවේ විශාලතම ද්විපාර්ශ්වික ණය දෙන්නන් වන අතර චීනයේ එක්සිම් බැංකුව මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීම සඳහා ඇමරිකානු ඩොලර් බිලියන 3.8 ක පමණ ණය ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට ලබා දී ඇත. එබැවින් මෙම පාර්ශ්වයන් සමග රජයේ බලධාරීන් සාකච්ඡා පැවැත්වීමට කටයුතු කර ඇත.

පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකින් ශ්‍රී ලංකාව මේ මොහොතේ බැටකන අවස්ථාවක ඉන් ගොඩවීමට හැකි මාර්ගයක් ලෙසට ණය ප්‍රතිව්‍යුහගත ගත කිරීමේ ක්‍රියාවලිය මේ දිනවල කතා බහක් ඇතිවී තිබේ. මේ දරුණු අර්බුදය සමනය කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ශ්‍රී ලංකාව සඳහා ණය ලබා දීමේ කාලය තීරණය කිරීමේ ප්‍රධාන සාධකය චීනය බවට පත්විය හැකි බව දේශීය හා ජාත්‍යන්තර විශ්ලේෂකයෝ පවසති.

ආර්ථික අර්බුදයට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාවට උපකාර කිරීමට චීනය එකඟ වී ඇති නමුත් මෙතෙක් කිසිදු ණය ප්‍රතිව්‍යුහගත සැලැස්මක් සඳහා කැපවී නොමැති බව ආර්ථික විශ්ලේෂකයන්ගේ මතයයි. කෙසේ වෙතත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළව චීනය මේ වන විට සෘජු පිළිතුරක් ලබා දී නැති අතර ඒ වෙනුවට ප්‍රතිමූල්‍යකරණ උපාය මාර්ගයක් යෝජනා කර ඇත. ඒ අනුව චීනය විසින් ශ්‍රී ලංකාවට ලබා දුන් ණය දිගින් දිගටම ගෙවීමට බලාපොරොත්තු වන අතර ඒ වෙනුවෙන් චීනය විසින් ශ්‍රී ලංකාවට තවදුරටත් ණය පහසුකම් ලබා දීම අරමුණු කරයි. දැනට සිදු කරන සාකච්ඡාවන් හරහා චීනයේ මෙම ස්ථාවරයේ වෙනස් වීමක් මෙරට බලධාරීන් ඉදිරියේ අපේක්ෂා කරයි.

චීනය සිය කොමියුනිස්ට් පක්ෂ සම්මේලනය ඔක්තෝබර් අගදී අවසන් කළ පසු ණය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළව සුබදායි තීරණයක් ගනු ඇති බවට මාධ්‍ය වාර්තා පළවී තිබුණත් මේ වන තෙක් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් එවැන්නක් සිදු වී නොමැත.

> පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකින් ශ්‍රී ලංකාව මේ මොහොතේ බැටකන අවස්ථාවක ඉන් ගොඩවීමට හැකි මාර්ගයක් ලෙසට ණය ප්‍රතිව්‍යුහගත ගත කිරීමේ ක්‍රියාවලිය මේ දිනවල කතා බහක් ඇතිවී තිබේ. මේ දරුණු අර්බුදය සමනය කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ශ්‍රී ලංකාව සඳහා ණය ලබා දීමේ කාලය තීරණය කිරීමේ ප්‍රධාන සාධකය චීනය බවට පත්විය හැකි බව දේශීය හා ජාත්‍යන්තර විශ්ලේෂකයෝ පවසති.
>
> ආර්ථික අර්බුදයට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාවට උපකාර කිරීමට චීනය එකඟ වී ඇති නමුත් මෙතෙක් කිසිදු ණය ප්‍රතිව්‍යුහගත සැලැස්මක් සඳහා කැපවී නොමැති බව ආර්ථික විශ්ලේෂකයන්ගේ මතයයි. කෙසේ වෙතත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළව චීනය මේ වන විට සෘජු පිළිතුරක් ලබා දී නැති අතර ඒ වෙනුවට ප්‍රතිමූල්‍යකරණ උපාය මාර්ගයක් යෝජනා කර ඇත. ඒ අනුව චීනය විසින් ශ්‍රී ලංකාවට ලබා දුන් ණය දිගින් දිගටම ගෙවීමට බලාපොරොත්තු වන අතර ඒ වෙනුවෙන් චීනය විසින් ශ්‍රී ලංකාවට තවදුරටත් ණය පහසුකම් ලබා දීම අරමුණු කරයි.

මේ නිසාම ජනාධිපති රනිල් වික්‍රමසිංහ නියෝජනය කරන දේශපාලන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ පිරිසක් පසුගිය දිනක චීන තානාපති කාර්යාලය ඉදිරිපිට උද්ඝෝෂණයක් සංවිධානය කර තිබුණි. කෙසේ වෙතත් එම උද්ඝෝෂණය සඳහා තම පක්ෂයේ සෘජු අධීක්ෂණයක් නොමැති බවට එක්සත් ජාතික පක්ෂය පසුව නිවේදනය කර තිබුණි.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ණය ලබා දුන් ප්‍රධාන රටවල් එකම ස්ථාවරයක සිටිමින් ප්‍රතිව්‍යුහගත කිරීමට එකඟතාවය පළකිරීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපේක්ෂා කරනු ලබයි.

ශ්‍රී ලංකාව සමඟ ඇති කර ගත් මූලික කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුමෙන් පසුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියා සිටියේ එක් ණය හිමියකු ණය ප්‍රතිව්‍යුහගත කිරීමට එකඟ නොවුණත්, එය ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකාවේ අර්බුදය ගැඹුරු අතකට ගෙන යනු ඇති බවයි.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ණය හිමියන් අතර පැරිස් සමාජය නියෝජනය කරන එකම රට ජපානයයි. පැරිස් සමාජය මූලිකව බටහිර රටවල්වලින් සැදුම්ලත් සංවිධානයක් වන අතර ඉන්දියාව සහ චීනය වැනි අනෙකුත් ප්‍රධාන ණය දෙන්නන් එහි සාමාජිකයන් නොවේ. එම නිසා ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතුවලදී ශ්‍රී ලංකාව ජපානයේ සෘජු මැදිහත් වීම අයැද සිටියි. ජනාධිපතිවරයා විසින් මේ සම්බන්ධයෙන් කිහිප වතාවක් ඉල්ලීම් කර තිබුණි. ඉන්දියාව සිය ස්ථාවරය ඉදිරිපත් කරමින් ඉතා යහපත් ප්‍රතිචාර මේ සඳහා පළ කර ඇති අතර ණය හිමියන් සමාන ලෙස සැලකීම සහ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ විනිවිදභාවයක් ඉන්දියාව අපේක්ෂා කර සිටියි.

පුද්ගලික සහ ද්විපාර්ශ්වික යන අංශ දෙකම නියෝජනය කරන ණයහිමියන් සමඟ තිරසාර එකඟතාවයකට එළඹෙන තුරු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉදිරි පියවරයන් මන්දගාමීව සිදු වනු ඇති බවට විශ්ලේෂකයන් මත පළකර සිටියි.

ඒ අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලයේ ඡන්දය ප්‍රකාශ කිරීමට ප්‍රථම අරමුදල් මුදා හැරීමට පෙර ශ්‍රී ලංකාව, චීනය සමඟ සාකච්ඡා කර ප්‍රගතියක් අත්කර ගත යුතුව තිබේ. ජාත්‍යන්තර විශ්ලේෂකයින් පවසන්නේ සැම්බියාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සමඟ චීනයේ හැසිරීම චීනය සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගනුදෙනුවක දී ශ්‍රී ලංකාවට අපේක්ෂා කළ හැකි දේ පිළිබඳ අවබෝධයක් ලබා දෙන බවයි. සැම්බියාව 2020 නොවැම්බරයේ ණය පැහැර හරින ලද අතර 2021 දෙසැම්බර් මාසයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ මූලික මට්ටමේ ගිවිසුමක් ඇති කරගැනීමට කටයුතු කරන ලදි. නමුත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඊට අනුමැතිය ලබා දුන්නේ මෑතකදී සමස්ත ණය ප්‍රමාණයෙන් කොටසක් පමණක් ප්‍රතිව්‍යුහගත කිරීමට චීනය එකඟතාව පළකිරීමත් සමඟ ය.


ඒ අනුව ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වැදගත් වන ප්‍රධාන සාධක දෙකක් ආර්ථික විශ්ලේෂකයන් හඳුනා ගෙන ඇත. ඉන් පළමු කරුණ වන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ශ්‍රී ලංකාවට ණය පහසුකම් ලබා දෙන්නේ කවදාද යන්නයි. දෙවන කරුණ ලෙසට හඳුනා ගෙන ඇත්තේ චීනය මෙම සිද්ධි මාලාවේදී කුමන ආකාරයකට කටයුතු කරන්නේද යන්නයි.

චීනය ඉතියෝපියාව සහ සැම්බියාව වෙත ණය ලබා දීමට සම්බන්ධ විය. එම රටවල් ද පසුගිය වසර දෙක තුළ ස්වෛරී ණය ගෙවීම පැහැර හරින ලදි.

ගොඩබිමක ඉදිකෙරෙන වරායක් සඳහා සහ ඵලදායි නොවන ගුවන්තොටුපළක් ඇතුළු යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකාව පසුගිය දශකය තුළ චීනයෙන් විශාල වශයෙන් ණය ලබාගෙන ඇත. ණය ගෙවීමට ප්‍රමාණවත් ආදායමක් උපයා ගැනීමට ව්‍යාපෘති අපොහොසත් වූ අතර එය ශ්‍රී ලංකාවේ ආර්ථිකය දුක්ඛිත තත්ත්වයට හේතු විය. ශ්‍රී ලංකාවේ මුළු ජාත්‍යන්තර ණයවලින් 10% ක් පමණ ලබා ගෙන ඇත්තේ චීනය මගිනි. එම ප්‍රමාණය ඇමරිකානු ඩොලර් බිලියන 7.3 ක් පමණ වේ. ජපානය ඩොලර් බිලියන 2.7 ක් සහ ඉන්දියාව ඩොලර් බිලියන 1.7 ක් ණය ලබා දී ඇත. ශ්‍රී ලංකා රජයේ වාර්තා අනුව ජූනි මස අවසානයේදී රටේ විදේශ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 46.6 ක් හෙවත් රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 70% ක් පමණ විය.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ණයවලින් සියයට 10 ක් පමණ චීනයෙන් ලබා ගෙන ඇත. එය මුළු ණය ප්‍රමාණයෙන් කුඩා ප්‍රතිශතයක් ලෙසට පෙන්නුම් කළත් ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා චීනයේ අනුමැතිය තීරණාත්මක ය. චීනය අතිරේක ණයක් ලබා දුන්නද, එය කිසිදු ප්‍රතිව්‍යුහගත කිරීමකට කැපවී නැති බැවින් ශ්‍රී ලංකාවේ ඉරණම අද වන විට චීනය මත රඳා පවතින තත්ත්වයට පත්ව ඇති බව මූල්‍ය විශ්ලේෂකයන්ගේ මතයයි. මේ වසර මුලදී ශ්‍රී ලංකාව නිදහසින් පසු දරුණුතම ආර්ථික අර්බුදයට ගොදුරු වූ විට, ඉන්දියාව ආහාර, ඖෂධ සහ ඉන්ධන හදිසි මිලදී ගැනීම් සඳහා ණය මුදල් හුවමාරු කිරීම සහ ණය ආපසු ගෙවීම කල් දැමීමේ පහසුකම් සහිතව ඩොලර් බිලියන 3.8 ක් වටිනා හදිසි ආධාර ලබා දීමට කටයුතු කර ඇත.

ශ්‍රී ලංකාවේ භූ දේශපාලනය සම්බන්ධයෙන් වන අරගලයේදී චීනය සහ ඉන්දියාව ප්‍රමුඛ තරගකරුවන් වන අතර ඔවුන්ගේ සැබෑ මිත්‍රත්වය ශ්‍රී ලංකාව දෙසට ප්‍රදර්ශනය කිරීම මෙය කදිම අවස්ථාවක් වනු නොඅනුමානය.




## ආතා අපේ

පාස්පෝට් ගාස්තු තව වැඩි කරලා
රජයෙන් තිබේ නව ඉමකට මුල පුරලා
මේ ගැන සිතාලා ඇස් දෙක කරකවලා
ආතා කතාවක් කිව්වා මුව බලලා

විදෙස් විනිම නැති වී තිබෙන විටදී
රට විරුවන්ට වැඩ කෙරුවොතින් බැටදී
ඇමැතිගෙ සියලු සැලසුම් එකට වරදී
හිඟ වී ඩොලර් ආයෙත් රටම පරදී

\- මුණුබුරා



# වහාම ක්‍රියාත්මක වන පරිදි පොලී අනුපාතවලට සීමා දැමිය යුතුයි

## වජිර අබේවර්ධන (එජාප)



# පාලකයන් රටේ සංවර්ධන ප්‍රමුඛතා තෝරාගැනීමට

# ලාභ ලබන ආයතන හා රජයේ ඉඩම් ජාවාරම්කාරයන්ට දෙන්න හදනවා

## ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා (සජබ)

රනිල් ධර්මසේන, අකිත පෙරේරා

වහාම ක්‍රියාත්මක වන පරිදි පොලී අනුපාතයන්ට සීමා පැනවිය යුතු බවත් එසේ නොවුණහොත් ව්‍යාපාර බිඳ වැටී රැකියා නැතිවී ජනතාව මහ පාරට වැටෙන බවත් පත් කළ මන්ත්‍රී වජිර අබේවර්ධන මහතා (එජාප) ඊයේ පාර්ලිමේන්තුවේදී පැවසීය.

වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා විසින් සෙංකෝලය තැන්පත් කිරීමෙන් පසුව කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ මූලාසනයෙන් යුතුව පාර්ලිමේන්තුව ඊයේ (18 දා) උදෑසන 9.30 ට නැවත ආරම්භ කෙරිණි.

ප්‍රථමයෙන් නිවේදන, ලිපි ලේඛන, වාචික වාර්තා, මහජන පෙත්සම් ආදිය ඉදිරිපත් කිරීමෙන් පසුව 2023 අයවැය යෝජනාවලිය පිළිබඳ දෙවැනිවර කියවීමේ විවාදය හතරවන දිනටත් ආරම්භ විය.

**විවාදය ආරම්භ කරමින් කතා කළ පත්කළ මන්ත්‍රී වජිර අබේවර්ධන මහතා (එජාප)**

රජය දිගින් දිගටම සිදුකළේ මහ බැංකුව හරහා මුදල් ඉල්ලීම පමණයි. මහ බැංකුව රජයට මුදල් නිකුත් කිරීම සිදුකළේ මුදල් අච්චු ගැසීමෙනුයි. මෙවැනි අධික මුදල් ප්‍රමාණයක් අච්චු ගසා රට තුළ සංසරණය කරවීමත් සමඟ රටේ උද්ධමනය දරාගත නොහැකි තත්ත්වයකට වැඩි වුණා.

මේ වනවිට උද්ධමන වේගය ඉතාමත් වැඩි අගයකට ළං වී තිබෙනවා. අහාර මිලෙහි උද්ධමනය 90% කට වඩා වැඩි අගයක් ගන්නවා. මේ නිසා අඩු ආදායම් ලබන පුද්ගලයන්ගේ ජීවන මට්ටම ඉතාම පහළට ඇද වැටුණා.

දරා ගත නොහැකි බඩු මිලෙහි ඉහළ යෑම නිසා දෛනික ආදායම් ලබන පුද්ගලයන් ඉතාම අසරණ තත්ත්වයට පත්වුණා. මේ තත්ත්වය නතර කිරීමට එවකට රජයට හැකියාවක් ලැබුණේ නැහැ. ඔවුන්ට ඒ පිළිබඳ දැනුමක් තිබුණෙත් නැහැ.

මෙවැනි තත්ත්වයක් උඩ පසුගිය අප්‍රේල් මාසයේදී රජය විසින් අප බංකොළොත් රටක් බවට ප්‍රකාශයක් නිකුත් කළා. ඒ නිසා අපට විදේශ රටවලින් ණය ආධාර දෙන එක පවා නතර කළා.

ඒ අවස්ථාව වනවිට සංචාරක ව්‍යාපාරයත් කඩා වැටී තිබුණු නිසා අපට විදේශ විනිමය ලැබුණේ විදේශ ගත ශ්‍රමිකයන් එවන මුදල්වලින් පමණයි. ඩොලර් ආදායම අඩු වුණත් අපට විදේශවලින් එදිනෙදා පරිභෝජනයට අදාළ බඩු භාණ්ඩ ගෙන්වා ගැනීම සීමා කළ නොහැකියි. ඉන්ධන, ගෑස්, පොහොර වැනි අත්‍යාවශ්‍යම භාණ්ඩ ගෙන්වීම නතර කළ නොහැකියි.

මේ හේතුන් නිසා අප රට තුළ සමාජ ප්‍රශ්න හට ගැනීම ආරම්භ වුණා. උදාහරණයක් විදිහට ගත්තොත් පොහොර නොමැති නිසා ගොවි ජනතාව මහත් පීඩනයකට ලක්වුණා. බෙහෙත් නොමැතිකමින් ලෙඩ වූ ජනතාව අසරණ තත්ත්වයට පත්වුණා. ඉන්ධන නොමැතිකමින් ජනතාවට දින ගණන් පෝලිම්වල සිටින්නට සිදුවුණා.

මේ සියලු ප්‍රශ්නයන් ආණ්ඩුවට සෘජුවම බලපෑවා. ඒ නිසා මෙය දේශපාලන අර්බුදයක් වගේම සමාජ අර්බුදයක් දක්වා වර්ධනය වුණා.

මේ නිසා ගොවීනුත් යම් ප්‍රමාණයකට සන්සුන් වී සිය වගා කටයුතු නැවත ආරම්භ කිරීමට කටයුතු කළා. ඒ වගේම අඩාල වී තිබුණු ආහාර නිෂ්පාදනයක් යම් ප්‍රමාණයකට වැඩි වෙන්නට පටන් ගත්තා.

පොහොර ප්‍රශ්නය යම් තාක් දුරකට විසඳීමත් සමඟ ග්‍රාමීය මට්ටමේ හට ගත් ගැටලු සම්පූර්ණයෙන්ම නැති වුනත් මේ වනවිට යම් තාක් දුරකට අඩු වී තිබෙනවා. නමුත් බඩ ඉරිඟු වැනි භෝගවල ඉහළ නිෂ්පාදනයක් මේ මොහොතේදීත් සිදුවන්නේ නැහැ. ඒත් ඉදිරි මාස කිහිපය තුළ මේ ප්‍රශ්නත් නිවැරදි වෙයි කියා අපට බලාපොරොත්තු විය හැකියි. බඩඉරිඟුවලින් නිෂ්පාදනය කෙරෙන සත්ත්ව ආහාර නිෂ්පාදනයත් වැඩි වීම හරහා කුකුල් මස් සහ බිත්තර නිෂ්පාදනයට එය රුකුලක් වේවි.

ඒ නිසා පොලී අනුපාතය පාලනයට සහ විනිමය අනුපාතය ස්ථාවර කරගැනීමට වෙනත් විකල්ප ක්‍රම අවශ්‍ය වෙනවා. උද්ධමනය පාලනය සඳහා දැනට අපිට එකම එක උපකරණයයි තිබෙන්නේ. ඒ පොලී අනුපාතය ඉහළ නැංවීම පමණයි. මේ නිසා බොහෝ කර්මාන්තකරුවන්ට ණය අරගෙන වැඩකටයුතු කරගෙන යෑමට නොහැකි වීම නිසා විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත විශාල අභියෝගයකට මුහුණපානවා.

ඇතැම් කර්මාන්ත මේ වනවිට වැසී ගොස් තිබෙනවා. තවත් ඒවා තමන්ගේ නිෂ්පාදන පරිමාව අඩුකර තිබෙනවා. මෙවැනි නොයෙක් ප්‍රශ්නවලට ඔවුන් මුහුණ පා තිබෙනවා. කර්මාන්ත යම් හෙයකින් වසා දැමුවහොත් එහි සේවය කරන සේවකයන්ගේ ආදායම් තත්ත්වය කඩා වැටෙනවා. එය සමාජයට සහ ආර්ථිකයට විශාල බරක්.

මේ වනවිට කෘෂිකර්මාන්තය යම් ස්ථාවර මට්ටමකට පැමිණ තිබෙනවා. නමුත් අපනයන හා නිෂ්පාදන කර්මාන්ත සම්බන්ධයෙනුත් යම් කිසි සාධනීය වැඩපිළිවෙලක් දියත් කළ යුතුයි. ඒ සඳහා රජය, පුද්ගලික අංශය මුදල් මණ්ඩලය, මහා භාණ්ඩාගාරය, අමාත්‍ය මණ්ඩලය වගේ සෑම අංශයක්ම එක විදිහකට ක්‍රියා කර මෙයින් ගොඩ ඒමට යම් මාර්ගයක් සාදා ගත යුතුයි. ණය නොගෙවීමේ තත්ත්වය තුළ විදේශ රටවලින් හෝ බහු පාර්ශවීය ආයතනවලින් අපට තවදුරටත් උදව් උපකාර ලැබෙයි කියා බලාපොරොත්තු වෙන්න බැහැ. ඒ සඳහා අපට අවස්ථාව ලැබෙන්න ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් සමඟ යම් නිශ්චිත අරමුණකට ළඟා වුනොත් පමණයි. මේ හේතුව නිසා රටේ ආර්ථිකය මුළුමනින්ම කළමනාකරණය කරන්නේ සිදුවන්නේ රට අභ්‍යන්තරයේ තිබෙන සම්පත්වලින්ම පමණයි.

නිෂ්පාදනය වැඩි වීම හරහා ආනයන අඩුකරගෙන අපනයන වැඩිකර ගැනීමේ හැකියාව ලැබෙනවා. මේ හරහා රැකියා අවස්ථා වැඩි වෙනවා. ඒ වගේම එමගින් විදේශ විනිමය අනුපාතය පාලනය කිරීමට හැකියාව ලැබෙනවා.

අපට පුළුවන් වෙයි ඩොලරය රුපියල් 360 ක සීමාවෙන් පහළට අරගෙන එන්න. ක්‍රම ක්‍රමයෙන් අපට හැකිවේවි විනිමය අනුපාතය සැලකිය යුතු ප්‍රමාණයකින් පහතට ගෙනවිත් ආනයනය කරනු ලබන අත්‍යාවශ්‍ය භාණ්ඩ, ආහාර සහ ඖෂධවල මිල අඩු කරලා පීඩාවට පත්වෙලා ඉන්න ජනතාවට සාධාරණයක් කරන්න.





ඒ වගේම දරාගත නොහැකි පොලී අනුපාතයක් ඇතිව ව්‍යාපාරිකයන්ට තවදුරටත් තමන්ගේ ව්‍යාපාර කරගෙන යන්න බැහැ. වැඩිකල් නොගිහින් මේ ව්‍යාපාර වැටෙනවා. ඒ වගේම කිසිම කෙනෙකුට ණයක් අරගෙන ගෙයක් දොරක් හදාගන්න තියා තියෙන ගෙයක් අලුත් වැඩියා කරගන්නවත් බැහැ.

මේ ආකාරයට රටේ තිබෙන ප්‍රධාන ප්‍රශ්න විසඳන්න බැහැ. මේ දරාගත නොහැකි පොලී අනුපාතයට උපරිම සීමාවක් දැමීමට මා යෝජනා කරනවා. ඒ වගේම දෙවනුව පොලී අනුපාතය ක්‍රමානුකූලව අඩුකිරීමේ වැඩපිළිවෙළක් රජයට ක්‍රියාත්මක කරන්න වෙනවා.



**පොහොර තහනමෙන් කුඩා තේවතු හිමියන්ට මරු පහරක් එල්ල වුණා**
**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න (ශ්‍රීලපොපෙ)**

මට මතකයි යහපාලන ආණ්ඩුව තිබෙන විට මූල්‍ය ණය ලබාදුන්නේ උපරිම පොලී අනුපාතයකට අනුවයි. ව්‍යවසායකයන් හා අනෙකුත් අයට අඩු පොලියට ණය ලබාදෙන්න නම් ස්ථාවර තැන්පතුවලට ලබාදෙන පොලිය පවා අඩුකළ යුතුයි.

ඒ නිසා මගේ යෝජනාව වෙන්නේ පොලී අනුපාතයට උපරිමයක් නැතිනම් කැප් එකක් දමන්න කියලා. නැතිනම් විකල්ප විසඳුමක් ඉදිරිපත් කරන්න ඕන. එහෙම සැලසුමක් පේන තෙක් මානෙකවත් නැහැ.

අපි පොලී අනුපාතය මේ විදිහට පාලනය නොකළහොත් ව්‍යාපාර කඩා වැටී ජනතාව ණය බරට යට වෙලා, රැකියා නැතිවෙලා, රටේ ඉන්න වැඩි හරියක් ජනතාවගේ දිළිඳුකම වැඩිවෙනවා. මේ තත්ත්වය අපි කවුරුත් දන්නවා වගේම සමාජ අරගලවලට හේතු වෙනවා. මිනිසුන්ගේ සාක්කුවේ තියන රුපියල ශක්තිමත් කරනවට විරුද්ධව ව්‍යාපාරයක් තියනවා. අපි එය හෙළි කළ යුතුව තියනවා.

ඒවගේම අපි බලන්න ඕන රජයේ සේවකයන්ගේ අතේ තියන රුපියල, ගත්ත ණය ගෙවාගන්න බැරි තත්ත්වයට පත් කරනව නම් ඒ කව්ද කියලා. පෞද්ගලික අංශය කඩා බිඳ දමනවා. ඒ කව්ද කියලා. මෙයට අපිට පාර්ලිමේන්තුවට යටත් වෙන්න බෑ.

**මාතලේ දිස්ත්‍රික් මන්ත්‍රිනී රෝහිණී විජේරත්න (සජබ) -**

අභිමි දශකයක පළමු අයවැයයි මෙවර ඉදිරිපත් වුණේ. මුල් අවුරුදු 3 තුළ විදේශ සංචිත බින්දුවට ගිය නිසා කෘෂිකර්මය නැති කළා. උද්ධමනය වැඩි කළා.

අරගලය ඇතිවෙන්න හේතුවූ කරුණුවලට විසඳුම් අයවයෙන් ඉදිරිපත් වී නෑ. නගින්න උදව් කරපු ඉනිමගට නම් පයින් ගහලා තියෙනවා. උද්ධමනය සියයට 70කට වඩා ඉහළයි. ජනතාවගේ ණය වැඩි වෙලා.

එදා මරුටි කාර් එකක හීන තිබුණු රටක අද එදාවේල කන එක හීනයක් කරලා. අපනයන කර්මාන්ත විනාශ වුණා. ඉදිකිරීම් කර්මාන්තය වැටිලා. ඒ ගැන අයවැයේ විසඳුම් නෑ. ගොවියන්ට ගංජා වවන්න හීනයක් දීලා තියෙනවා.



**විදේශ විනිමය අර්බුදයට කිසිම යෝජනාවක් නැහැ**
**ගෙවිඳු කුමාරතුංග (ශ්‍රීලපොපෙ)**

මේ අයවැයෙන් මධ්‍යම පාන්තිකයා ඉවරයි. හූරලාම බදුගන්න ක්‍රමයක් තියෙන්නේ. ලක්ෂ 5 ක ආදායම තිබූඅයෙක් දොළොස් ලක්ෂයක් බදු ගෙවන්න වෙලා. කිසිම වැටුප් වැඩිවීමක් නැහැ. විශ්‍රාමිකයන්ට බෙහෙත් ටික ගන්න බැරිවෙලා. මධ්‍යම පන්තිය තමයි රට ශක්තිමත් කරන්නේ. ඒ නිසා ඔවුන්ව ශක්තිමත් කළ යුතුයි.

ආර්ථිකය නංවන්න හොරා කාපුවා නැවත ලබා ගත යුතුයි. බදු නොගෙවා හැංගුණු මිනිස්සු අල්ලා ගන්න උපායශීලී මාර්ග අවශ්‍යයි. රට විනාශ කරපු පිරිසක් එක්ක රට හදන්න බැහැ. ඒ නිසා ජනමතයට හිස නමලා අලුත් ආණ්ඩුවක් පිහිටුවා ගන්න.

**කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී ජගත් කුමාර සුමිත්‍රආරච්චි (ශ්‍රීලපොප) -**

රටේ ජනතාවට ප්‍රශ්න තිබෙන විත්තිය විපක්ෂය කිව යුතු නැහැ. අපිට හොඳින් දැනෙනවා. ඒ නිසා තමයි ප්‍රශ්න තිබුණත් වැඩිහිටි හා සමාජ සුභසාධන දීමනා දිගට ම දෙන්න තීන්දු කර තිබෙන්නේ. ළමා පෝෂණය වැඩි කිරීමට මුදල් වෙන්කර තිබෙනවා.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රශ්න තියෙනවා. ඒ ගැන අවධානය යොමු කළ යුතුයි. නැතිවූ බදු ආදායම ලබාගත යුතුයි. ආනයනය අඩු කර අපනයනය වැඩි කිරීමට පියවර ගත යුතුයි. එහිදී අපනයන අලුත් අංශ කෙරෙහි අවධානය යොමු කළ යුතුයි.

**පත්කළ මන්ත්‍රී රංජිත් මද්දුම බණ්ඩාර (සජබ) -**

ජනතාව අතිශය පීඩනයට පත්වෙලා ඉන්න යුගකයි අවැය ගෙනාවේ. 2019 වනවිට විදේශ ණය ගෙවන්න සතපහක් හිඟ තබුණෙ නෑ. ජනතාව පෝලිම්වල හිටියේ නෑ. 2019 ආපු පාලනය නිසයි රට මේ තත්ත්වයට වැටුණේ.

මෝඩ විදියට බදු කපාහැරියා, කෘෂිකර්මාන්තය විනාශ කළා. පාලකයන්ගේ වැරදි නිසා ජනතාව වන්දි ගෙවනවා. වැරදි කරපු පිරිසම රනිල් ජනාධිපති කළා.

අද පාසල්වල දරුවෝ ක්ලාන්තේ දාලා වැටෙනවා. විශ්වවිද්‍යාල දරුවන් දේශනාවලදී ක්ලාන්තය දාලා වැටෙනවා. අද බදු ජනතාවට ගෙවා ගන්න බැරි තත්ත්වයක් ඇතිවෙලා. ජල බිල, විදුලි බිල වැඩි කළා. වැට්එකයි, සමාජ ආරක්ෂණ බද්ධයි ඉදිරියේදී වැඩි කරන්න යනවා.

**හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන -**

අයවැයෙහි හොඳ යෝජනා වගේම පිළිගත නොහැකි යෝජනාත් තිබුණා. දේශීය වියදම් කළමනාකරණයකර, දේශීය සම්පත්වලින් උපරිම ප්‍රයෝජනය ගැනීම කළ යුත්තක්.

සත්ත්වයින්ගෙන් වගාවට සිදුවන හානි ගැන මම කතා කළේ මීට වසර 15කට පෙරයි. තවම විසඳුමක් හොයා ගන්න බැරි වුණා. මේ අර්බුදයට වෙනත් රටවල් දීලා තියෙන විසඳුම් දෙන්න බැහැ.

අද රටේ ඇතිවී තිබෙන තත්ත්වයට යම් යම් පාලකයන් ගත් වැරදි තීන්දු හේතු වුණේ. අපි සර්වපාක්ෂික ආණ්ඩුවක් පිහිටුවා ප්‍රශ්න විසඳීමට ගත් උත්සාහය ව්‍යවර්ථ වුණා.

පාසල් 1000 ක දරුවන්ට පරිගණක දෙන්න ගත්ත තීරණය හොඳයි. ඒත් පාසල් 500කට පරිගණක දීලා ඉතිරි මුදලින් දරුවන්ට පොත්පත් අරන් දුන්නොත් එය වඩාත් වැදගත්.

වයස අවුරුදු 60 න් විශේෂඥ වෛද්‍යවරු විශ්‍රාම යැවීම වැරදි තීන්දුවක්. කොවිඩ් සමයේ විශේෂඥ වෛද්‍යවරු පවුල්පිටින් රටින් ගියා. ඒ නිසා අඩුම තරමින් වයස 65 වත් කළ යුතුයි. පොලොන්නරු රෝහල ශික්ෂණ රෝහලක් ලෙස උසස් කරන්න ගත් තීරණය හොඳයි.



**එදා වේල කන එක හීනයක් : අරගලයට හේතු වූ කරුණුවලට විසඳුම් ඉදිරිපත් වී නෑ**
**රෝහිණී විජේරත්න (සජබ)**

මහවැලි අධිකාරියෙන් මහවැලි ඉඩම් බැහැර කරලා ප්‍රාදේශීය ලේකම්ට දුන්නොත් මහවැලි අධිකාරිය වැසී යනවා. මම ජනපති සමයේත් මේ යෝජනා ආවා. ක්‍රියාත්මක කරන්න දුන්නේ නෑ.

**පුත්තලම දිස්ත්‍රික් මන්ත්‍රී චින්තක අමල් මායාදුන්න (ශ්‍රීලපොපෙ) -**

මේ රට ගොඩ නගන වැඩපිළිවෙළ කඩාකප්පල් කිරීමට උතුරේ නායකයන් ක්‍රියාකරනවා. අද මුස්ලිම් සිංහල පිරිසට උතුරේ ජීවත් වෙන්න බැහැ. නමුත් දකුණේ හැම ජාතියක්ම සමගිව ජීවත් වෙනවා.

මේ රටේ හොඳ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න හැමෝම එකතු විය යුතුයි. තුනකට බෙදී වෙන්වී චෝදනා කර ගැනීම ජනතාවට කරන ද්‍රෝහී කමක්.

**සෞඛ්‍ය ඇමැති කෙහෙළිය රඹුක්වැල්ල -**

පසුගිය වසර 75 න් වසර 40 ක්ම රට විනාශකාරී තත්ත්වයට ගියේ. යුද්ධයේදී රටපුරා ආර්ථික මරමස්ථාන විනාශ කළා. ඒ වගේම 88/89 බස් ගිනි තිබ්බා. රටපුරා ලේ වැගිරුවා.

මේ අය වැය අනාගතයක් හිතන්න පුළුවන් දෙයක්. මෙතෙක් කල් වුණේ දෙපැත්තෙන් වැරදි හා හොඳ කියනවා. මෙවර හොඳ දේ ගැන කතා කරනනවා වැඩියි.

සමාජ පීඩනයත් සමගම දේශපාලනඥයාගේ භූමිකාවත් වෙනස් විය යුතුයි. සමාජ පීඩනය තේරුම් ගත් දේශපාලකයකු විය යුතුයි. සියලු දෙනා නිශ්චිත කාලයකට නිශ්චිත වැඩපිළිවෙළකට එළැඹිය යුතුයි.

**පත් කළ මන්ත්‍රී ගෙවිඳු කුමාරතුංග (ශ්‍රීලපොපෙ) -**

මේ අයවැයේ කමිටු පත් කිරීම නම් කර තියෙවා. විදේශ විනිමය අර්බුදයට කිසිම යෝජනාවක් නෑ. බදු වැඩි කිරීම් කිරීමට නම් යෝජනාවී තිබෙනවා.

මේ වසර බදු ආදායම බිලියන 1858ක්. එය උපයා ගත හැකිද? මේ වසරේ බදු ආදායම එම මාර්ගයේ නෑ. බදු ආදායම නම් සියයට 69ක පමණ වැඩි වීමක් තිබෙනවා. ඇතැම් ව්‍යාපාර වැසී ගොස් ලැබෙන ආදායමත් මේ තුළින් නැතිවී යා හැකියි.



**අයවැය පණ අදිමින් සිටි මිනිසුන්ගේ ගෙල සිඳ දැමුවා**
**කාවින්ද ජයවර්ධන (සජබ)**

**ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා -**

රටේ සංවර්ධනයේ ප්‍රමුඛතා තෝරා ගැනීමට පාලකයන් මේ දක්වා කටයුතු කර නෑ. දුෂ්කරතා තියෙනවා කියලා බදු ගහනවා. ජනතාවට දුක් විඳින්න පුළුවන්ද? හතරදෙනකුගේ පවුලකට ජීවත්වෙන්න පුළුවන්ද?

කාසල් රෝහල් අධ්‍යක්ෂවරයා කියලා තියෙනවා ලේ වාර්තා ගන්න ක්‍රමයක් රෝහලේ නෑ කියලා. නොමිලේ දුන් වෛද්‍ය පහසුකම් මේ අය මුදලට දෙන්න යෝජනා කරනවා.

අය වැය කතාවේ සිහින ලෝකයේ ජීවත්වීමක් තියෙනවා. ක්‍රියාත්මක කිරීමට යෑමේදී දූෂිත ව්‍යාපාරිකයන්, දේශපාලකයන් ක්‍රියාත්මක වෙනවා.

සමහර දේශපාලකයන්ගේ දූෂිත ක්‍රියා නිසා ආයෝජකයන් රටට එන්නේ නෑ. දූෂණය තියෙනකං රට දියුණු කරන්න බැහැ.

රටේ පෝලිම් ක්‍රමය නැති වුණේ කූපන් ක්‍රමය ඇති වූ නිසයි. නැතිව භාණ්ඩ තිබෙන නිසා නොවෙයි. උද්ධමනය පාලනය වෙලා කියලා කිව්වා. සියලු බඩු මිල වැඩිවෙලා. තෙල් මිල වැඩිවෙලා. විරැකියාව ඉහළයි. එහෙම තිබියදී උද්ධමනය පාලනය වෙලා කියන්නේ කවුද?

අපේ නායකයන්ට දුෂ්කර මාවත මතක් වුවත් දූෂිත නායකයන් නිසා ඒ මාවත මතක්වීමෙන් වැඩක් නැහැ. ආයතන විකිණීම පාඩු ලැබීම වැළැක්වීමට පිළියමක් නොවෙයි. ලාභ ලබන ආයතන ජාවාරම්කාරයන්ට දීමේ උත්සාහයක් පවතිනවා. සමහර ආයතනවල ලක්ෂ 40 - 50 පඩි ගන්නවා.

තරුණ පරපුර පමණක් නොව සියලුම ජනතාව ආරක්ෂා කරගත යුතුයි. තරුණයන් නිහඬ කරන්න උත්සාහ කරමින් ඉන්නවා. තරුණ හඬට කන් දෙන්නේ නෑ. වසන්ත මුදලිගේ හා සිරිධම්ම හිමි නිහඬ කරන්න කොපමණ උත්සාහ කළා ද කියා පේනවා.

සමහර වහල් පොලිස් නිලධාරීන් යොදවා තරුණයන්ට පහර දෙන්න උත්සාහ කරනවා. ඔවුන්ට බෙහෙත් දෙන්න අපි ඉදිරි කාලයේදී කටයුතු කරනවා.

රජයේ ඉඩම් බදුදෙන්න කියන්නේ හෙංචයියන්ට ඉඩම් ජාවාරම්වලට ගන්නයි. මේ රටේ සුද්දාට මොළය තිබ්බා තේ, පොල්, රබර්, කොකෝවා ගෙනවිත් විදේශ විනිමය ගේන්න. මේ අය ගංජා වවලා විනිමය හොයන්න හදන එක ගැන ලැජ්ජා හිතෙනවා.

මේ අය බීඩියෙනුත් බදු ගැහුවා. ඉදිරියේදී මේ අය ටොයිලට්වලටත් බදු ගහයි. කොමඩ්වලටත් මීටර් සවි කරයි. බුලත්විට කඩල වෙළෙන්දාටත් බදු ගසයි.

රට ගොඩනැගීමට නම් දූෂිත දේශපාලනඥයන් ගෙන් රට බේරාගත යුතුයි. මගේ හෘද සාක්ෂියට අනුව මෙය කළ හැක්කේ අරගලයකින් හෝ නිර්පාක්ෂික ක්‍රියාවලියකින් පමණයි. අරගලය ආයුධවලින් තොරයි.

**රත්නපුර දිස්ත්‍රික් මන්ත්‍රී ඩබ්ලිව්. ඩී. ජේ. සේනවිරත්න (ශ්‍රීලපොපෙ) -**

අද අපිට සහල් පිටරටින් ගෙන්වන්න වෙලා. ඒ තරමට රට පසුගිය වසර 74 දී වට්ටලා. පටු දේශපාලන න්‍යායපත්‍ර පසෙකලා ජනතාව වෙනුවෙන් පොදු ජාතික ප්‍රතිපත්තියක් සැකසීම අවශ්‍යයි.

පෞද්ගලික රෝහල්වල ජනතාව සූරාකෑම් සිදුවන නිසා රජයේ රෝහල්වල ගෙවන වාට්ටුවලින් සාධාරණ මිලකට ප්‍රතිකාර ගත හැකියි.

කුඩා තේ වතු හිමියෝ රත්නපුරයේ ඉන්නවා. තේ කර්මාන්තයට පොහොර තහනමින් මරු පහරක් වැදුනා. දැන් පොහොර දුන්නත් ප්‍රමාණවත් නැහැ.

**හම්බන්තොට දිස්ත්‍රික් මන්ත්‍රී වෛද්‍ය උපුල් ගලප්පත්ති (ශ්‍රීලපොපෙ) -**

රජය බදු විශාල ලෙස වැඩි කරලා තියෙනවා. මේ නිසා උද්ධමනය වැඩි වෙලා. ගන්න පඩියෙන් ජීවත්වෙනවා හැර වෙන දෙයක් කරන්න බැහැ. ණය ගෙවා ගන්නත් බැහැ.

ඉදිරියේදී බදු නිසා තෙල් මිල වැඩි වෙනවා. එය හැම අංශයටම බලපානවා. අද වනවිට පෞද්ගලික ව්‍යවසායකයා නිෂ්පාදන කාර්යයෙන් ඉවත් වෙනවා. එවිට සේවකයා මහපාරට වැටෙනවා. රැකියා වියුක්තිය වැඩිවෙනවා. ජනපති ඒ බව දන්න නිසයි රැකියා අහිමි වන අයට දීමනාවක් දෙන්න යෝජනා කරන්නේ.

අයි. එම්. එෆ්. එක කියන විදිහට සියල්ල කරනවා. නමුත් ණය ලැබෙන්නේ කවදාද කියලා කවුරුත් දන්නේ නෑ. සිහින අයවැය ජනපති සිතන ආකාරයට කරගන්න බැරි වේවි.



**බදු නිසා තෙල් මිල වැඩිවීම සෑම අංශයකටම තදින් බලපාවි**
**වෛද්‍ය උපුල් ගලප්පත්ති (ශ්‍රීලපොපෙ)**

**මාතර දිස්ත්‍රික් මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ (ශ්‍රීලපොපෙ)**

රටේ ජනතාව ආර්ථික අර්බුදයේ පීඩාවට ලක් වෙලා. මෙයින් ජනතාව බේරා ගැනීමට දීර්ඝ කාලීන විසඳුමකට යා යුතුයි. ලෝකයේ ආර්ථිකය පහළ යනවා. අපේ රටේ ක්‍රමවේදයකට අනුව ආර්ථිකය හසුරුවාගෙන රට ගොඩනැංවීමට සියලු දෙනා එක්වෙමු.

**ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී කාවින්ද ජයවර්ධන (සජබ)**

මේ අයවැය පණ අදිමින් හිටපු මිනිසුන්ගේ බෙල්ල කැපූ එකක් ලෙස හඳුන්වනවා.

මේ අයවැයෙන් මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන්ට දෙන ආධාරය ගැන සඳහනක් නෑ. ත්‍රිපෝෂ කර්මාන්ත ශාලාව තුළින් පෝෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වුණා. එය අඩපණයි. අද බිත්තරයක් ගන්න නෑ. පාලන මිලට බිත්තර නෑ. පෝෂණය ලබාගන්න ක්‍රමයක් නෑ.

ධීවර ජනතාව බිලියන ගණනින් රටට ඩොලර් ගෙනවා. අද ධීවරයා අන්ත අසරණ වෙලා. එන්ජින් ඔයිල්, දැල් ආම්පන්න, භූමිතෙල් මිල විශාල ලෙස වැඩිවෙලා. ජනතාවට පෝෂණය අඩු වෙන තැනට ධීවර ක්ෂේත්‍රය පත්වෙලා.

අද ජනතාව විඳින දුකට වගකිවයුතු අයට නිදැල්ලේ ඉන්න දෙන්න එපා. බදු අය කරන්න පෙර බදු වංචා කරමින් ඉන්න අයගේ බදු මුලින්ම අය කරගන්න. නිවැරදිව බදු අය කරන්න.

**මොනරාගල දිස්ත්‍රික් මන්ත්‍රී වෛද්‍ය ගයාශාන් නවනන්ද (ශ්‍රීලපොපෙ)**

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට වෛද්‍ය පීඨයක් පිහිටුවීමට ගත් තීරණය ඉතා හොඳයි.

පසු අස්වනු හානි අවම කිරීමට ශීත ගබඩා ඇති කිරීමට යෝජනා වී තියෙනවා. මම කලින් ආණ්ඩුවේ අමාත්‍යාංශයට ශීත ගබඩා හදන්න යෝජනා කළාම අපේ රටට ශීත ගබඩා වැඩක් නෑ කියලා මග ඇරියා.

පාර්ලිමේන්තුව අද (19 දා) පෙරවරු 9.30 යළි රැස්වෙයි.

# අමතර කොටස් හිඟයෙන් ● රුහුණු ඩිපෝවේ බස් බොහොමයක් කොට උඩලු

ලලිත් චාමින්ද සහ එස්.කේ. කළුආරච්චි - ගාල්ල

ශ්‍රී ලංගම රුහුණු ප්‍රාදේශිකයට අයත් බස් රථ 40ක් පමණ බ්‍රේක් ලයිනර් වැනි අමතර කොටස් සහ කාර්මික දෝෂ වලට ලක්වීමෙන් ධාවනය කිරීමට නොහැකි තත්ත්වයක් උදාවී ඇති බැව් ශ්‍රී ලංගම රුහුණු ප්‍රාදේශිකයේ ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකරු ආර්.වී. ප්‍රභාත් කුමාර මහතා පවසයි.

බස් රථ සඳහා බ්‍රේක්ලයිනර් හිඟය දැඩිලෙස බලපා ඇති බවද හෙතෙම පෙන්වා දුන්නේය. රුහුණු ප්‍රාදේශිකයට ඩිපෝ 11 තුළ බස් රථ 540 ක් තිබෙන අතර දිනපතා බස් රථ 460ක් පමණ ධාවනය වන බවද ආර්.වී. ප්‍රභාත් කුමාර මහතා පවසයි.

වාර ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම සඳහා මගීන් විශාල සංඛ්‍යාවක් යොමුවීම සහ මගීන් අඩුවීම අදි හේතු නිසා රුහුණු ප්‍රාදේශිකයේ දිනපතා ආදායම අඩුවී ඇති බව පෙන්වා දෙන හෙතෙම මේ වන විට රුහුණු ප්‍රාදේශිකයේ දිනපතා ආදායම එක්කෝටි හැටලක්ෂයක් දක්වා පහත වැටී ඇති බවද සඳහන් කළේය.

## මාධ්‍යවේදී මරදන්කඩවල ක්‍රිෂ්ණක සචින් 'දේශ ගෞරව කීර්ති' සම්මානයෙන් පිදුම් ලබයි



තිරප්පනේ සමන් පෙරේරා

සංස්කෘතික අමාත්‍යංශයේ අනුමත ''සත්ජන සංස්කෘතික පදනම" මඟින් 2023 වර්ෂය වෙනුවෙන් ගෞරව සම්මාන පිරිනැමීමේ උළෙල පසුගියදා පොළොන්නරුව බුද්ධි මණ්ඩපයේ දී පැවැත්විණි. සමාජයට, කලාවට සහ සංස්කෘතියට ආදී ලෙස විවිධ අයුරින් සමාජ සේවාවන් වල නිරතවන ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින සමාජ සේවකයින් පනහකට ආසන්න පිරිසකට මෙහිදී ගෞරව සම්මාන හිමිවිය.

එහිදී කලාවට, සමාජයට සහ සංස්කෘතියට සිදුකරන අමිල මෙහෙය වෙනුවෙන් ප්‍රාදේශීය මාධ්‍යවේදියකු වන මරදන්කඩවල ක්‍රිෂ්ණක සචින් කරුණාරත්න මහතා ''දේශ ගෞරව කීර්ති" ගෞරව සම්මානයෙන් පිදුම් ලැබුවේය. ප්‍රවීණ රංගන ශිල්පී ක්ලීටස් මෙන්ඩිස්, සත්ජන පදනමේ සභාපති දේශමාන්‍ය අජිත් සුසන්ත, සත්ජන පදනමේ උප සභාපතිනි ප්‍රවීණ රංගන හා ගායන ශිල්පිණී කුමාරි මුණසිංහ යන මහත්ම මහත්මීන් මෙන්ම තවත් ප්‍රවීණ කලාකරුවන්, පූජ්‍ය පක්ෂය මෙන්ම සම්මාන ලාභීන්ගේ පවුලේ පිරිස්ද මේ අවස්ථාවට සහභාගී වී සිටියහ.

## ඇමෙරිකාවේ ලංකාරාම විහාරයේ කඨින පිංකම

### පූජා කරන ලද සියලු පිරිකර පීඩා විඳින ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් ලබාදෙනවා

### විහාරාධිපති පූජ්‍ය තලංගම දේවානන්ද හිමි



පින්බර වස්කාලය අවසානය සනිටුහන් කරමින්, ඇමෙරිකාවේ ලොස්ඇන්ජලීස් නුවර ලංකාරාම විහාරස්ථානයේ උතුම් කඨින පිංකම ඉතා උත්කර්ෂවත් අන්දමින් නිමාව සනිටුහන් කරන ලදී. මෙවර ඇමෙරිකාවේ ලොස් ඇන්ජලීස් හි ලංකාරාම විහාරස්ථානයේ වාර්ෂික කඨින පිංකම දෙස් විදෙස් බැතිමතුන්ගේ සහභාගිත්වයෙන් නොවැම්බර් මස 06 වන ඉරිදා දින විහාරාධිපති පූජ්‍ය තලංගම දේවානන්ද නාහිමිපාණන්ගේ අනුශාසකත්වයෙන් හා සංවිධායකත්වය පෙරදැරිව සියලු මහා සංඝරත්නයේ ආශිර්වාද මධ්‍යයේ බුද්ධාලම්බන ප්‍රීතියෙන් යුක්තව සිදු කළහ.

ශ්‍රී ලංකාවේ මෙන් පුරාණ චාරිත්‍රානුකූලව සිවුර පඬු පොවා වර්ණ ගන්වමින් කඨින චීවරය සකසා ඉතා අලංකාරවත් පෙරහැරකින් කඨින චීවරය වඩම්වා සියලු දෙස් විදෙස් බැතිමතුන්ගේ සාධුකාර මධ්‍යයේ මහා සංඝරත්නය විෂයෙහි පූජා කරන ලදී. මෙවර කඨින පිංකමේ පිංබර දායකත්වය ලැබුවේ දිලිප් ජයසේකර, වත්සලා ජයසේකර හා රන්දිල් ජයසේකර යන පවුලේ පින්වතුන් මෙන්ම දොස්තර ලලනි වර්ණකුලසූරිය, දොස්තර කුමාරි ජයවර්ධන, උපාලි ලියනගේ යන පින්වතුන්ගේ හා සියලු සැදැහැති පිං වතුන්ගේ සහභාගිත්වයෙනි. මේ උතුම් කඨින පින්කම තුළින් විහාරස්ථානය වෙත සැදැහැති පිංවතුන් විසින් පූජා කරන ලද සියලු ආධාරයන් ශ්‍රී ලංකාවේ ආර්ථික අපහසුතා නිසා පීඩා විඳින අපේම ජනතාව වෙනුවෙන් වෙන් කරමින් ඔවුන්ට අවශ්‍ය වියළි ආහාර මළු ලබාදීමට කටයුතු සිදුකරමින් පවතින බව විහාරාධිපති පූජ්‍ය තලංග දේවානන්ද හිමියන් පවසන ලදී.

## ගනේමුල්ල බොල්ලත අභිනවයෙන් ඉදිකරන ලද සාන්ත අන්තෝනි නිවාස සංකීර්ණය විවෘත කිරීමඃ

# වසර 74ක් අපේ දේශපාලන නායකයෝ කළේ මිනිසුන් රවටන එකයි

### කොළඹ අගරදගුරු මැල්කම් රංජිත් කාදිනල්තුමා





නෝමන් පලිහවඩන සහ ගම්පහ සමූහ සුසිල් රණමුක

මේ රටේ දිගටම වසර 74 ක් තිස්සේ, අපේ දේශපාලන නායකයෝ කළේ බොරු කියමින් මිනිසුන් රවටන එක යැයි, කොළඹ අගරදගුරු මැල්කම් රංජිත් කාදිනල්තුමා පැවසුහ.

2019 පාස්කු දින කොළඹ කොච්චිකඩේ දේවස්ථානයේ සිදුවූ ත්‍රස්ත බෝම්බ ප්‍රහාරයට ලක්ව මිය ගිය අයගේ අසරණ බවට පත් පවුල් වෙනුවෙන් ගනේමුල්ල, බොල්ලත, පහළ වත්තේ, අභිනවයෙන් ඉදිකරනලද සාන්ත අන්තෝනි නිවාස සංකීර්ණය විවෘත කිරීමේ උත්සව සභාව අමතමින් උන්වහන්සේ එසේ ප්‍රකාශ කර සිටියහ. ඉතාලියේ කරිටාස් අන්තෝනියෝ ආයතනයේ පරිත්‍යාග යටතේ ඉදිකරන ලද මෙම නිවාස සංකීර්ණයේ නිවාස දොළහක් පාස්කු දින ත්‍රස්ත ප්‍රහාරයෙන් මිය ගිය අයගේ පවුල් කීපයකට පවරාදීමට මෙදින කටයුතු කරන ලදී. එහිදී පැවැති උත්සව සභාවේ ප්‍රධාන ආරාධිත දේශනය පවත්වමින් අගරදගුරු කාදිනල්තුමා වැඩි දුරටත් මෙසේද පැවසුහ. හිටපු ජනාධිපතිවරයා මට පෞද්ගලිකව පොරොන්දු වුණා, පාස්කු දින ඛේදවාචකය සම්බන්ධයෙන් විනිවිද පරීක්ෂණයක් කරනවා කියා. මුළු රදගුරු මණ්ඩලය ඉදිපිටදීත් ඔහු එම පොරොන්දුව දුන්නා. ජනාධිපති කොමිෂන් සභා වාර්තාව එතුමා අතට පත් වුණාට පස්සේ දැන් මට කියනවා එම කොමිෂන් සභා නිර්දේශ ඔක්කොම කරන්නේ කොහොමද කියලා. ඒ කියන්නේ එතුමාට කරන්න බැරි නිර්දේශත් එහි තිබුණා කියන එකයි. මෙම සිද්ධිය පිළිබඳ කොමිෂන් සභා පදනම් වාර්තාවට අයත් කරුණු සඟවන්නේ ඇයි, කාට බයේද? මිනිසුන් එක්කෙනෙක් දෙන්නෙක් නොවෙයි මෙම සිද්ධියෙන් 272 ක් මියගියා. 500ක් විතර තුවාල වුණා. ඇතැම් අය මුළු ජීවිත කාලයම රෝද පුටුවට නැතිනම් ඇඳට සීමා වෙලා. සිරිසේන ජනාධිපතිවරයා නේද, රටේ ආරක්ෂාව පිළිබඳ එදා හිටිය පළමු වැනියා. ඇයි එයා ජනාධිපති කොමිටි ඉල්ල, ඉල්ලා හැංගෙන්නේ. මේ ප්‍රහාරය පිටුපස ඉන්නේ මුස්ලිම් අන්තවාදින් විතරක් නොවෙයි, දේශපාලන කුමන්ත්‍රණයකුත් මෙහි තිබෙනවා. ඒ ගැන පාර්ලිමේන්තු තේරුම් කාරක සභා සමුළු සමරියේ සඳහන්ව තියෙනවා.

මේ පිළිබඳ කියන්න ඕනේ හැම තැනකටම අපි කිව්වා, ලිඛිතව දැන්වූවා. පෙළපාලි ගියා, උද්ඝෝෂණය කළා. අපිට යන්න දැන් තැනක් නැහැ. ජාත්‍යන්තරයටත් මේ ගැන කිව්වා , අපි හෙටත් කියනවා. ශුද්දෝත්ම පාවුළු පාප්තුමා කියා තිබෙන අයුරින් අපි හැමවිටම ගන්නේ බලවතාගේ පැත්ත නොවෙයි, පීඩිතයාගේ පැත්තයි. ශුද්දෝත්තමතුමා, මෙම වැරදි වලට කවදා හෝ දඬුවම් ලබා දෙන බවට අපට විශ්වාසයි. බුදු දහමට අනුවත් කර්ම විපාක පල දේවි යැයි අගරදගුරු හිමිපාණෝ පැවසුහ. මෙදින පැවැති උත්සව සභාවට කොළඹ අගරදගුරු පදවියේ සහයක ඇන්තනි රංජිත් පියතුමා, ඉතාලියේ සංක්‍රමණිකයන්ගේ ශ්‍රී ලංකා නියෝජිත නෙවිල් ජෝ , අගරදගුරු පදවි ඉඩම් හා දේපළ පරිපාලක නිහාල් ප්‍රදීප් සහ බොල්ලත කතෝලික මීසම් පාලක ඇන්ටන් නිරෝෂන් යන පියතුමන්ලා ඇතුළු සාන්ත අන්තෝනි දේවස්ථානයේ පූජක පියතුමන්ලා මෙන්ම රාජ්‍ය ආයතන නියෝජනය කරමින්, ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා චතුරිකා පින්තු , ගම්පහ ප්‍රාදේශීය ලේකම් සුරංගි ගුණතිලක, ප්‍රාදේශීය සභා සභාපති රංජිත් ගුණවර්ධන, ගනේමුල්ල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කේ. දේවප්‍රිය යන මහත්ම මහත්මීන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් රැසක් සම්භාවනීය ආරාධිත අමුත්තන් වශයෙන් එක්ව සිටියහ.

## මතුගම අතිරේක දිසා අධිකරණයට එන චූදිතයන්ට පහසුකම් නැතිලු

බුලත්සිංහල එම්. ආර්. ප්‍රේමරත්න

අධිකරණයේ නියම කරන දණ්ඩනයට අමතරව චූදිතයන් උදේ 9.00 සිට සවස 2.003.00 දක්වා කාලය තුළ සිටගෙන නඩු වාර වලට පෙනීමටත්, ඔවුන් අධිකරණ සංකීරණයේ ගල් වැටි මත සහ බිම වාඩිවී නඩු වලට පෙනී සිටීමටත් සිදුව ඇතැයි චූදිතයෝ පවසති.

නඩු වලට සහභාගී වන චූදිතයන්ට හදිසි අවශ්‍යතා සඳහා ඇත්තේ ගල් මුල් උඩින් පැන යන ඉතාමත් අපිරිසිදු කාන්තා සහ පිරිමි වැසිකිළියකි. ඇතැමුන් ගස් ගල් වලට මුවාවී සිය අවශ්‍යතා කරගන්නා සෙයකි. ඩෙංගු මදුරුවන් බෝ කරන චූදිතයන්ට දඬුවම් දෙන දිසා අදිකරණය ඩෙංගු මදුරුවන් බෝ කරන තෝතැන්නකි.

අධිකරණ සංකීරණයේ වැහි පීලී අපද්‍රව්‍ය වලින් පිරී පවතී.

බිංගෙයක් වැනි විනිශ්චය ශාලාව ඇතුළත 25-30 ප්‍රමාණවත් චූදිතයන්ට පමණක් වාඩිවීමේ පහසුකම් ඇත. මතුගම දිසා අධිකරණය මඟින් බුලත්සිංහල, මතුගම සහ බදුරලිය යන පොලිස් ස්ථානවල වල පොලිස් නඩු විභාග කරයි. පහසුකම් සහිත අධිකරණ සංකීරණයක මෙන්ම වැසිකිළි පද්ධතියක අවශ්‍යතාවය මෙහි හොඳහැටි දක්නට ලැබේ. බලධාරින්ගෙන් අවධානය මේ පිළිබඳ හැකි ඉක්මණින් යොමුවිය යුතුව තිබේ.

## හරක් බලා ගනිමින් සිටි එඬේරාව යකඩ යකා යට කරලා

කන්තලේ ඩබ්.එම්.වික්‍රමසිංහ

කන්තලේ ගංතලාව ප්‍රදේශයේ පදිංචි පුද්ගලයකු ප.ව. 5.00 ට පමණ කන්තලේ සිට ත්‍රිකුණාමලය බලා ගමන්ගත් දුම්රියේ හැපීමෙන් සිද්ධිය වූ ස්ථානයේදීම මිය ගොස් ඇතැයි කන්තලේ පොලිසිය කියයි.

මිය ගොස් ඇත්තේ සුභද්‍ර කන්කානම්ලාගේ සමන්තිලක(53) නම් කුලී වැඩකරන විවාහකයෙකි. මිය ගිය අය රේල් පාර අසලම පදිංචි පුද්ගලයකු වන අතර තම හරක් රංචුවක් ඒ අසල තෘණ කෑමට බැඳ උන් බලාගන්නා අතරතුර මිය ගිය අයට නින්ද යාම හේතුවෙන් මෙලෙස දුම්රියට බිලිවී ඇති බව පොලිස් පරීක්ෂණ වලදී නිරීක්ෂණය වී ඇත. සිද්ධිය සම්බන්ධයෙන් කන්තලේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්. එම්. සිරිවර්ධන මහතාගේ උපදෙස් මත සුළු පැමිණිළි අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක කේ. එම්. සාපි මහතාගේ මූලිකත්වයෙන් පොලිස් සැරයන් සේනානායක(51205) සහ පොලිස් කොස්තාපල් ගුණතිලක(76744) යන මහත්වරුන් වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

## දුරකථනයෙන් හාදවී රන් පොල්ලක් තියලා

බඩල්කුඹුර රවිඳු ගුණතිලක

දුරකථන ඇමතුමකින් හඳුනාගත් පුද්ගලයකුට තමා ළඟ රන් කැබලි තොගයක් තිබෙන බවත් ඒවා අලෙවි කරගැනීමට උදව් කරන ලෙසත් පවසා ව්‍යාජ රන් කැබලි ලබාදී රු. ලක්ෂ පහළොවක් වංචා කළ පුද්ගලයකු ඉකුත්දා මොනරාගල පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු පොතුවිල් ප්‍රදේශයේ පදිංචි 26 හැවිරිදි තරුණයෙකි.

පැමිණිලිකරු ගාල්ල උඩුගම වත්තේ කළමනාකරුවකු ලෙස සේවය කරන අතර සැකකරු විසින් ඔහුට දුරකථන ඇමතුමක් ලබාදී තමා ළඟ රන් කැබලි තොගයක් තිබෙන බව පවසා ඒවා විකුණා ගැනීමට උදව්කරන ලෙස දැනුම්දී ඇත. පැමිණිලිකරු ඒ අනුව මොනරාගල බස් නැවතුම් පොළට පැමිණ ඇති අතර සැකකරු විසින් ඔහුට රන් කැබැල්ලක් සාම්පලයක් ලෙස ලබාදී ඇති අතර පැමිණිලිකරු එය රන් භාණ්ඩ අලෙවි කරන මධ්‍යස්ථානයකට ගොස් පරීක්ෂාකර ඇති අතර එය නියම රන් කැබැල්ලක් බවට හඳුනාගෙන ඇත.

පසුව ඉතිරි රන් කැබලි තොගය ගැනීමට ඔහු එකඟවී මොනරාගල දිස්ත්‍රික් මහ රෝහල අසලට තවත් අයකු සමඟ පැමිණ සැකකරු ළඟ තිබූ රන් කැබලි තොගය රු. ලක්ෂ පහළොවක් ලබාදී මිලදීගෙන ඇත. පසුව පරීක්ෂා කිරීමේදී එම රන් කැබලි ව්‍යාජ ඒවා බවට හඳුනාගෙන ඇත.

සිද්ධිය පිළිබඳ මොනරාගල පොලිසියට පැමිණිලි කිරීමෙන් අනතුරුව මුදල් ලබාගෙන වංචාකර සාපරාධී විශ්වාසය කඩකිරීමේ චෝදනාව මත සැකකරුට එරෙහිව නඩු පැවරීමට පොලිසිය කටයුතු කරගෙන යයි. මොනරාගල මූලස්ථාන පොලිස් පරීක්ෂක පී.එස්. චාමින්ද සංජීව මහතා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් වැටලීම සිදුකර ඇත.

## කසළින් තොර දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වසන් දහයක් තෝරා ගනිමින් සෙටින් ආයතනය විසින් 'කසළින් තොර නගරයක්' යන තේමාව පෙරදැරි කර ගනිමින් පරිසර හිතකාමී ව්‍යාපෘතියක් දියත් කරනු ලැබිණි. එයට සමගාමීව පරිසර දිනය වෙනුවෙන් දෙල්තොට නගරය ඉතා අලංකාරවත් ලෙස ශුද්ධ පවිත්‍ර කිරීමට කටයුතු යොදා තිබිණි.

මෙම වැඩසටහන සඳහා දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමිය, ගලහ පොලිසිය, සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය, ග්‍රාම නිලධාරි මහත්ම මහත්මීන් ඇතුළු ආගමික නායකයන් මෙන්ම ප්‍රදේශයේ තරුණ තරුණියන් මෙන්ම කුඩා දරුවන් ද සහභාගි වූහ. එමෙන්ම මෙම වැඩසටහනේ සුවිශේෂත්වය වන්නේ පළාතේ ජීවත් වන සිංහල, දෙමළ, මුස්ලිම් ප්‍රජාව ජාති භේදයෙන් තොරව මේ සඳහා දායකත්වය ලබාදීමයි. කසළවලින් තොර නගර නිර්මාණය කිරීම සංකල්පය මෙයට අවුරුදු තිහකට පෙර මුල්වතාවට යුරෝපයේදී හඳුන්වා දෙන ලදී. වාණිජ පාරිභෝජන රටාව වැඩිවීමත්, ප්ලාස්ටික් අපද්‍රව්‍ය සහ ටින් කළ ආහාරවල බහලුම් කොටස් හේතුවෙනුන් යුරෝපයේ නගර පුරා කසළ ගොඩගැසීම වැඩි විය. මේ නිසා කසළ ගොඩවල් තුළින් මතුවන මීතේන් සහ ඇමෝනියා යන වායුවල හේතුවෙන් ප්‍රදේශය දුර්ගන්දවත් විය. එසේම කසළ ආශ්‍රිතව බෝවන මැසි මදුරු ප්‍රජාවන් පණුවන් සහ වෙනත් ජීවීන් නිසාත් පරිසරයට හටගන්නා තර්ජනය ක්‍රමයෙන් විශාල වූ අතර එයට මුහුණ දීම බරපතළ පාරිසරික ගැටලුව හේතුවෙන් කසළවලින් තොර නගර සංකල්පය බිහි විය.

සුජානි ගුරුගේ

## කොල්ල කෑම් 25යි සොරකම් 6යි උපාධිධාරියා අත්අඩංගුවට



කැස්බෑව බිමල් ජයසිංහ

ඇමරිකාවේ පරිගණක මෘදුකාංග ඉංජිනේරු උපාධියකට හිමිකම් කියූ 25 හැවිරිදි පුද්ගලයකු කොළඹ ප්‍රදේශයේ සොරකම් සහ කොල්ලකෑම් රැසක් සම්බන්ධයෙන් නාරහේන්පිට, කිතුල්වත්ත ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් බව කොළඹ අපරාධ කොට්ඨාසය කියයි.

සැකකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී හෙරොයින් මත්කුඩු ග්‍රෑම් 7 මිලිග්‍රෑම් 800 ක් පොලිසිය භාරයට ගෙන ඇත. කොල්ලකෑම් 25ක් සහ සොරකම් 6 සිදුකර රු. කෝටියක පමණ දේපළ කොල්ලකා ඇති සැකකරුගෙන් සිදු කළ දීර්ඝ ප්‍රශ්න කිරීමේ දී රු. ලක්ෂ 30 ක පමණ වටිනාකමින් යුත් ස්මාර්ට් වර්ගයේ ජංගම දුරකථන සහ රන්මාල කීපයක් පොලිසිය මඟින් සොයාගෙන ඇත. මහ මග නවතා තිබෙන යතුරුපැදි සොරා ගෙන කොළඹ ඇතුළු තදාසන්න ප්‍රදේශවල සැරිසරමින් මහ මග තනිවම යන කාන්තාවන් ඉලක්ක කරගෙන ඔවුන් සතුව තිබෙන අත් බෑග් කොල්ල කෑම මෙම සැකකරු කාලයක සිට සිදු කර තිබූ බව පොලිස් විමර්ශනවලදී අනාවරණ වී ඇත. සැකකරු එම අත් බෑග් වල තිබෙන මුදල් වලට අමතරව ජංගම දුරකථන සහ රන් භාණ්ඩ මෙන්ම ඒ.ටී.එම්. කාඩ්පත් ලබා ගෙන ඔහු සතු පරිගණක දැනුමද උපයෝගී කරගනිමින් එහි මුදල් ලබා ගෙන ඇතැයි පොලිසිය කියයි. පෞද්ගලික විශ්ව විද්‍යාලයකින් අධ්‍යාපනය ලබා ඇති සැකකරු ඉංග්‍රීසි භාෂාව චතුර ලෙස කතා කිරීමටත්, ලිවීමටත් සහජ දක්ෂතාවක් දක්වන්නෙක් බව පොලිසිය කියයි. සැකකරු මහරගම, දෙපානම ප්‍රදේශයේදී නීතීඥවරියකගේ අත් බෑගය කොල්ල කා එහි තිබූ වටිනා ජංගම දුරකතනය ලබාගෙන ඒ.ටී.එම්. කාඩ් පතේ මුදල් සියල්ල ලබාගෙන තිබූ බව පොලිස් නිලධාරියකු පැවැසීය.

නාරාහේන්පිට, වැල්ලම්පිටිය, මහරගම, කොහුවල, මිරිහාන, පිලියන්දල, මාලබේ සහ වැලිකඩ ආදී පොලිස් වසම් වලදී කොල්ලකෑම් සහ යතුරුපැදි සොරා ගැනීම් සිදුකර තිබූ බව සැකකරුගෙන් දීර්ඝ ලෙස සිදු කළ ප්‍රශ්න කිරීමේදී අනාවරණය කර ගැනීමට හැකි වී ඇත.

ජංගම දුරකතනයෙන් ඇමැතුමක් ලබා ගන්නා ආකාරයෙන් වෙළඳසල් ඉදිරිපිට නවතා තිබෙන යතුරුපැදි අසල මද වේලාවක් රැඳී සිට එහි හිමිකරු ළඟ පාතක නොමැති බවට තහවුරු කරගැනීමෙන් අනතුරුව යතුරු පැදි රැගෙන යාම කර තිබුණි.

ඒ ආකාරයෙන් යතුරුපැදි හයක් වරින්වර සොරකම් කර කිසියම් කොල්ල කෑමක් සිදු කිරීමෙන් අනතුරුව එම යතුරු පැදිය මහ මග දමා වෙනත් යතුරු පැදියක් සොරා ගෙන පලා යාම සැකකරු පුරුද්දක් ලෙස කර තිබේ. 25 හැවිරිදි සැකකරු මිතුරන් මාර්ගයෙන් අයිස් මත් ද්‍රව්‍ය භාවිතයට දැඩිව ඇබ්බැහිව සිටින්නෙකි. අත්අඩංගුවට ගත් සැකකරු මහරගම, පන්නිපිටිය, සෙත්සිරි පෙදෙස පදිංචිකරුවෙකි. බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාසයේ අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා යන මහත්වරුන් ගේ උපදෙස් මත ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා මහතාගේ මෙහෙයවීමෙන් සංවිධානාත්මක අපරාධ විමර්ශන ඒකකයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ආර්. එල්. ආර්. මධුරංග, උප පොලිස් පරීක්ෂකවරුන් වන එච්. ජී. එස්. ප්‍රියමන්ත, ඩී. සී. බණ්ඩාර, පොලිස් සැරයන් (57241)උපුල් සහ (51237)බණ්ඩාර යන මහත්තුරුන් පිරිස පරීක්ෂණ පවත්වති.

පොලිස් කොස්තාපල්වරුන් වන (73011)සමන්, (74400) ජනිත්, (84333)වික්‍රමනායක, (88139)ලසන්ත, (91691)චතුරංග, (11509)චතුරංග, (3122)උදයංග සහ (1117)මධුමාල් මහත්තවරුන් පිරිස පරීක්ෂණවලට සහාය වූහ.

## දෙල්ගොඩ සහ අවට ඒසී හොරා දැලේ

බියගම සුදත් පුබුදු කීර්ති සහ දෙල්ගොඩ ඩබ්ලිව් ඩී. එම්. විතාන

වායු සමීකරණ යන්ත්‍ර වල පිටතින් සවිකර ඇති මැෂින් ගලවා ගන්නා හොරකු ඒසී මැෂින් 17 ක් සමග මීගහවත්ත පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු විසින් රාත්‍රී කාලයේදී ඉතා සූක්ෂම අයුරින් සොරා ගන්නා ඒසී මැෂින් කඩුවෙල ප්‍රදේශයේ වායු සමීකරණ යන්ත්‍ර නඩත්තු කටයුතු සිදුකරන පුද්ගලයින් දෙදෙනකුට රු. 40,000 සහ 35,000 අතර මුදලකට මොහු විසින් විකුණා තිබූ බව පොලිසිය කියයි.

දෙල්ගොඩ ප්‍රදේශයේ රාජ්‍ය බැංකුවක් ඇතුළු ස්ථාන තුනක මොහු විසින් ඒසී මැෂින් සොරාගන්නා සී.සී.ටී.වී. දර්ශන පරීක්ෂා කර අදාල සැකකරු දෙල්ගොඩ සියඹලාපේවත්ත ප්‍රදේශයේ තම බිරිඳගේ මවගේ නේවාසිකාගාරයේ සිටියදී පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

කඩවත, කිරිබත්ගොඩ, බියගම සහ සපුගස්කන්ද යන පොලිස් වසම් වල මොහු විසින් වායුසමීකරණ යන්ත්‍ර මැෂින් මෙසේ සොරාගෙන ඇති අතර තදින් හෙරෝයින් මත්කුඩු වලට ඇබ්බැහි වී ඇති මෙම සැකකරු කඩුවෙල, කොරතොට ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 36 ක විවාහක පුද්ගලයෙකි. අදාල සැකකරු මහර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

# පුංචි ඡන්දය කල්දැම්මොත් ජනතාව එදාට පාරට බහිනවා

**- සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂා විතානගේ**

අකිත පෙරේරා

**පළාත් පාලන මැතිවරණය කල්දැමීමට ආණ්ඩුව ක්‍රියා කළහොත් එදාට ජනතාව මහ පාරට බහින්න සූදානමින් සිටින බව සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂා විතානගේ මහතා පැවසීය.**

විපක්ෂ නායක කාර්යාලයේදී පෙරේදා (17 දා) පැවති මාධ්‍ය හමුවේදී හෙතෙම මේ බව කී අතර එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් මන්ත්‍රීවරයා මෙසේද කීය.

'රටේ ජනතාව අන්දලා, බොරු කියලා, ජනතාවගේ ඔලුව විකෘති කරලා, තමන්ගේ ගමන යන්න මේ සැරේ ලේසි වෙන්නේ නැහැ. ඒ නිසා මැතිවරණයක් තියන්න කොමිසමේ සභාපතිවරයා මේ වෙනකොට කැමැත්ත පළ කරල අවශ්‍ය පියවර ගනිමින් ඉන්නවා. මැතිවරණයක් ජනතාව ඉල්ලන්නේ ඇයි මේ වෙලාවේ? පාර්ලිමේන්තුව තුළවත්, ප්‍රාදේශීය සභා තුළවත් ජනමතයක් මේ ආණ්ඩුවට නෑ.

රටේ ජනතාවට අවස්ථාවක් දෙන්න ඕන මේ අගාධයෙන් රට ගොඩ ගන්න අවශ්‍ය තමන්ගේ නිවැරැදි තීන්දු ගන්න. ඒක සමගි ජන බලවේගයද, පොදු ජන පෙරමුණද වෙනත් මොකක්ද කියන එක වෙනම කාරණයක්. හැබැයි ජනතාවගේ අයිතිය ලබා දෙන්න.

මේ වනවිට මැතිවරණ කොමිසමේ සභාපති අයින් කර දාලා වෙනත් කෙනෙක් ගේන්න සූදානම් වෙනවා. තමන්ට හොඳ හෙංචයියෙක් දාගෙන තව ටික කාලයක් අදින්න තමයි සූදානම. දිනේෂ් ගුණවර්ධන අගමැතිතුමනි, ජනාධිපතිතුමනි මේ සෙල්ලමට ලෑස්ති වෙන්න එපා. මේ කරන අරගල වගේ නෙමෙයි රටේ ජනතාව බලෙන් මේ වෙනකොට තමන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය අහිමි කර පාරට බහින්නේ. අනිවාර්යෙන්ම ජනතාවගේ අභිලාෂයන් වෙනුවෙන් ජනතා ජයග්‍රහණයන් වෙනුවෙන් ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය තහවුරු කිරීම වෙනුවෙන් පෙරමුණ අරගෙන අප කටයුතු කරනවා. ඒ නිසා දිනේෂ් ගුණවර්ධන මහත්තයා හරි ඇමැතිවරයෙක් හරි කවුරුහරි හිතාගෙන ඉන්නව නම් අපි ප්‍රාදේශීය සභාව කල්දානවා කියලා ඒවා ලෙහෙසි වෙන්නේ නැහැ කියන එක මතක් කර දෙනවා.



## ජනාධිපති හීනයේ ඉන්න නාමල්ට මේ රටේ අහිංසක මනුස්සයා වෙනුවෙන් කට අරින්න බැරිද?

පාස්පෝට් එක 20,000 දක්වා වැඩි කරලා. රියැදුරු බලපත්‍රය ලබා ගැනීම වැඩිකරලා. රාජ්‍ය ඇමතිවරු තිස් අටක් පත් කරගෙන මේ තිස් අටදෙනා පෝෂණය කරන්න කෝටි ගාණක් වියදම් කරන්න පුළුවන් රනිල් වික්‍රමසිංහට. ඒක දිහා බලාගෙන ඉන්න පුළුවන් දිනේෂ් ගුණවර්ධනට. ඒක දිහා බලාගෙන ඉන්න පුළුවන් රාජපක්ෂලාට. හීන මවාගෙන ඉන්න සහ ජනාධිපති හීනයේ ඉන්න නාමල් රාජපක්ෂට මේ රටේ අහිංසක මනුස්සයා වෙනුවෙන් සාධාරණයක් කරන්න කට අරින්න බැරිද? මේ තිස්අට දෙනා තියන් ඉන්නේ තමන්ගේ දේශපාලන ඉත්තෝ විදියට. ඒ අයගෙන් මම අහනව එක රාජ්‍ය ඇමතිවරයෙක් කියන්න මම මේ වැඩේ කරනවා කියලා. මට ප්‍රතිපාදන හම්බවෙලා තියෙනවා අමාත්‍යංශයේ වැඩ කරන්න කියලා. කිසිම ඇමති කෙනෙක්ට ප්‍රතිපාදන ලැබිල නැහැ. රාජ්‍ය ඇමතිවරුන්ට තියෙන්නෙ වාහන ටික ගන්නවා, තෙල් ටික ගන්නවා. නිලධාරි ටික අරගෙන තමාගේ ළඟම ඉන්න කණ්ඩායමක් දාලා පඩි ටික ගන්නවා. ඒ වෙනුවෙන් රාජපක්ෂ මහත්තයට, රනිල් වික්‍රමසිංහ මහතාට කඩේ යනවා. ඒ කඩේ යෑම වෙනුවෙන් ආණ්ඩුව පවත්වාගෙන යෑමේ හයිය හදාදීම වෙනුවෙන් තමයි මේ රාජ්‍ය ඇමතිකම ලැබිලා තියෙන්නෙ.

ඊයේ පෙරේදා අභියෝගයක් කළා සනත් නිශාන්ත මහත්තයා, මා වෙනුවෙන් ලක්ෂ 40කට වැඩිය වියදමක් යනවා නම් අයින් වෙනවා කිව්වා. මම දැන් ඒ අභියෝගයට උත්තර දුන්නා. සනත් නිශාන්ත මහත්තයා වෙනුවෙන් ලක්ෂ 40ක් නෙමෙයි ලක්ෂ සීයකට වැඩිය යනවා. ඇයි අමාත්‍යංශ කාර්යාලයේ සේවක මණ්ඩලය, වාහන ටික එතුමට දීලා තියෙන, සේවා දුරකථන පහ මේ ඔක්කොම එකතු කරලා බැලුවම බිලියන 10 ක විතර මහා වියදමක් යනවා. සනත් නිශාන්ත මහත්තයලා කරන වැඩ මොනවද කියල මේ රටේ මිනිස්සු දන්නවා. ඒ නිසා මහින්ද රාජපක්ෂ මහත්තයාගේ දේශපාලන ක්‍රමය රනිල් වික්‍රමසිංහ මහත්තයා අනුගමනය කරමින් නාමල් රාජපක්ෂට පාර හදන්න තවත් මෙලෝ වැඩක් නැති රටට කිසිම වැඩක් නැති රාජ්‍ය ඇමැතිවරු තිස් අටක් දාලා, මේ රටේ මිනිස්සුන්ට කියනවා උඹලා පාස්පෝට් එකට වැඩියෙන් ගෙවාපල්ලා, සෙස් බදු ගෙවන්න ලෑස්ති වෙයල්ලා, ලක්ෂයට බදු ගෙවන්න ලෑස්ති වෙයල්ලා, භාණ්ඩවලට වැඩිකරන එක දරාගන්න ලෑස්ති වෙයල්ලා කියලා.

# චීන ජනපතිගේ ජාත්‍යන්තර තානාපති අගමැති දිනේෂ් ගුණවර්ධන හමුවෙයි



ශ්‍යාම් නුවන් ගනේවත්ත

**යටිතල පහසුකම්, මානව සම්පත් සහ අවශ්‍ය අනෙකුත් පහසුකම් සැලකිය යුතු මට්ටමෙන් ක්‍රියාත්මක වන බැවින් ශ්‍රී ලංකාව විදෙස් ආයෝජන ආකර්ෂණය කරගැනීමට සූදානම් බව චීන ජනපති ෂී ජින් පිං මහතාගේ ජාත්‍යන්තර තානාපතිවරයා අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා හමුවේ පවසා තිබේ.**

අග්‍රාමාත්‍ය කාර්යාලයේදී පසුගියදා අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා හමුවූ චීන ජනපතිවරයාගේ ජාත්‍යන්තර නියෝජිත ලින් සොන්ග්ටියාන් (Lin Songtiyan) මහතා සහ ශ්‍රී ලංකාවේ චීන තානාපති කී සෙන්ග්හොන්ග් (Qi Zhenhong) මහතා මේ බව සඳහන් කර ඇත.

විදේශ රටවල් සමඟ මිත්‍රත්වය පවත්වාගැනීම සඳහා වූ චීන සංගමයේ සභාපති ලින් සොන්ග්ටියාන් මහතා මෙම සාකච්ඡාවේදී පැවසුවේ විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට දැන් අවශ්‍ය වන්නේ නීතිමය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම බවයි. අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කර ආයෝජකයින්ට හිතකාමී වාතාවරණයක් ඉක්මනින් ස්ථාපිත කෙරුණහොත් හම්බන්තොට, ත්‍රිකුණාමලය ඇතුළු අනෙකුත් ආර්ථික කලාප මෙන්ම කොළඹ වරාය නගරයද ගෝලීය ආකර්ෂණයට ලක්වීමට බොහෝ ඉඩකඩ ඇති බව ඒ මහතා වැඩිදුරටත් පැවසීය.

ඉන්දියන් සාගර මධ්‍යයේ උපාය මාර්ගික ස්ථානයක පිහිටීම, මහාමාර්ග, වරායන් මෙන්ම කාර්මික හා කෘෂිකාර්මික සංවර්ධනයේ ඉදිරි පිම්මක් සඳහා අවශ්‍ය නිපුණතා සහිත තරුණ ශ්‍රමිකයන්ගෙන් සමන්විත වීම වැනි සියලුම සුදුසුකම් ශ්‍රී ලංකාව සතුව ඇත. විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම සඳහා නව බලශක්ති ප්‍රභවයන් අත්‍යාවශ්‍ය බැවින් සූර්ය බලය සහ සුළං බලය සඳහා ප්‍රමුඛත්වය දිය යුතු බව තානාපති සොන්ග්ටියාන් පැවසීය.


මෙම සතිය මුලදී චීනයේ පැවති දෙමුහුන් සහල් ප්‍රභේද පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය මාර්ගගත ක්‍රමය ඔස්සේ අමතා අග්‍රාමාත්‍ය ගුණවර්ධන මහතා සිදුකළ දේශනය පිළිබඳ සඳහන් කරමින් තානාපති සොන්ග්ටියාන් ශ්‍රී ලංකාවේ දෙමුහුන් වී වගාව සඳහා නියමු ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට චීනය සූදානම් බව සඳහන් කළේය.

විදේශ හවුල්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද ආයෝජන යෝජනා කඩිනමින් විශ්ලේෂණය කොට සහතික කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කිරීම රජයේ ප්‍රමුඛතාව බව අග්‍රාමාත්‍යවරයා චීන නියෝජිත පිරිසට පැහැදිළි කළේය. සූර්ය බලශක්තිය, සුළං බලය සහ වෙනත් විකල්ප බලශක්ති සම්පත් වැනි නව ක්ෂේත්‍රවල ආයෝජන ශ්‍රී ලංකාව විසින් අපේක්ෂා කරන බව ද අග්‍රාමාත්‍යවරයා සඳහන් කළේය.

මෙම අවස්ථාවට අග්‍රාමාත්‍ය ලේකම් අනුර දිසානායක මහතා සහ චීන විදේශ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් එක්ව සිටියහ.

# ඉන්දීය හමුදා උපදේශකවරුන්ගෙන් ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා නිලධාරීන්ට පුහුණු පාඨමාලාවක්





**වෙලින්ටන් හි ආරක්ෂක සේවා මාණ්ඩලික විද්‍යාලයේ සහ පූනේහි තාක්ෂණය පිළිබඳ හමුදා ආයතනයේ සන්නද්ධ හමුදා උපදේශකවරුන්ගෙන් සමන්විත සිවි සාමාජික නියෝජිත පිරිසක් පසුගියදා ශ්‍රී ලංකා සංචාරයක නිරත විය.**

එම නියෝජිත පිරිස බටලන්ද ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලා හදාරන ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා නිලධාරීන් සඳහා නවීනතම හමුදා තාක්ෂණය සහ වර්තමාන සහ අනාගත යුදමය කටයුතු සඳහා එහි භාවිතය පිළිබඳ පුහුණු කැප්සියුලයක් පැවැත්විය.

ඉන්දියාවේ ආරක්ෂක සේනා පුහුණු ආයතන වාර්ෂිකව ශ්‍රී ලංකාවට පුහුණු අවස්ථාවන් 1500 ක් (යුද හමුදාව සඳහා - 900 ක්, නාවික හමුදාව සඳහා 350ක්, ගුවන් හමුදාව සඳහා 250 ක්) පමණ ලබාදෙති. ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ගේ ධාරිතා සංවර්ධනය උදෙසා ඉන්දියාව දක්වන දැඩි කැපවීම සහ මෙවැනි වැඩසටහන් ඉන්දියාවේ ''අසල්වැසියා ප්‍රථමයෙන්'' යන ප්‍රතිපත්තිය පිළිඹිඹු කරන අතර කලාපීය සාමය, ආරක්ෂාව සහ ස්ථාවරත්වයට දායකත්වය ලබා දෙමින් ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා අතර පවතින සුහද සබඳතා පෝෂණය කිරීමේ වැදගත්කම අවධාරණය කරයි.



# වෑතර මහා විද්‍යාලයේදී දරුවන්ගේ සුහදත්වය වර්ධනය කරන උත්සවයක්

පොල්ගස්ඕවිට, වෑතර මහා විද්‍යාලයේ (ජාතික පාසල) ලෝක ළමා දිනයට සමගාමීව හා සිසු දරුවන්ගේ සුහදත්වය වර්ධනය කිරීම සඳහා මෙම විදුහලේ විදුහල්පති මේජර් පී. කේ. ජී. පී. පෙරේරා මහතා සමග ගුරු මණ්ඩලය විසින් ඉකුත් දින විද්‍යාලයේදී උත්සවයක් සංවිධානය කර තිබුණි. මෙදින සිසු දරුවන් හට දිවා ආහාරය හා අයිස්ක්‍රීම් ලබා දෙන ලදී. ඒ සඳහා බොරලැස්ගමුව, එගොඩවත්ත සිංහ සමාජය අනුග්‍රහයෙන් ත්‍යාග ලබාදුන් අතර ඊගල් රිකවරි ආයතනයේ අසංක සිසිර කුමාර මහතා විසින් පාසලේ සිසු දරුවන් හට දිවා ආහාරය ලබාදෙන ලදී. මෙම අවස්ථාවට ජනප්‍රිය රංගන ශිල්පීන් වන කුසල් මධුරංග, දමින්ද නන්දරත්න, ඒ. එල්. විහඟ අබේවික්‍රම හා දෙමව්පියෝද සහභාගි වූහ. ඡායාරූපයෙන් දැක්වෙන්නේ බොරලැස්ගමුව, එගොඩවත්ත සිංහ සමාජයේ සිංහාධිපතීන් එක්ව පාසලේ සිසු සිසුවියන්හට පාසල් උපකරණ කට්ටලයක් ලබාදුන් අවස්ථාවයි.

ඡායාරූප හා සටහන පොල්ගස්ඕවිට සුසිල් ඉලේපෙරුම

# බැසිල් ඇවිත් පොහොට්ටුවට නව ජවයක් දෙනවා

**- එස්. බී කියයි**

නෝමන් පලිහවඩන



බැසිල් රාජපක්ෂ මහතා ලබන ඉරිදා ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ වැඩවල ඔහු නිරතවීමට බොහෝදුරට ඉඩ තිබෙන බව පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. බී. දිසානායක මහතා ''දිවයින''ට ඊයේ (18 දා) පැවසීය.

බැසිල් රාජපක්ෂ මහතා ඉරිදා ශ්‍රී ලංකාවට පැමිණෙන බව දැනගැනීමට ලැබී තිබෙන්නේ යැයි ද දිසානායක මහතා සඳහන් කළේය.

බැසිල් රාජපක්ෂ මහතා ඇමෙරිකාවේ සිට ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු ඔහු දේශපාලනයට පිවිසිනවා දැයි කියා ඇසූ පැනයට පිළිතුරු දෙමින් හෙතෙම එසේ ප්‍රකාශ කළේය.

# බැසිල් නොවෙයි ශක්‍රයා ආවත් පොහොට්ටුව ගොඩගන්න බැහැ

**- තිස්ස අත්තනායක**



අනුරාධ හිරිපිටියගේ

බැසිල් රාජපක්ෂ නොව සක්‍රයා පැමිණියත් පොහොට්ටුව යළි ගොඩනැගිය නොහැකි යැයි සමගි ජන බලවේගය ජාතික සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක මහතා ඊයේ (18දා) පැවසීය.

බැසිල් රාජපක්ෂ මහතා ඇමෙරිකාවේ සිට ඉරිදා යළි ශ්‍රී ලංකාවට පැමිණෙන බවට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරුන් කර ඇති ප්‍රකාශ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ඔහු මේ බව කීවේය.

2019 පාර්ලිමේන්තු මැතිවරණය හා ජනාධිපතිවරණයේ දී ජනතාව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කෙරෙහි අසීමිත විශ්වාසයක් තැබූවත් ඔවුන් එය පලුදු කරමින් රට බංකොලොත් කළේ යැයිද හෙතෙම සඳහන් කළේය. මොළ හතක් තියෙනවා කියූ බැසිල් රාජපක්ෂ ද අසාර්ථක හිස් මිනිසකු බව ජනතාව මේ වන විට නිගමනය කර ඇතැයි ද අත්තනායක මහතා කීවේය. පොදුජන පෙරමුණට මෙරටෙහි යළි දේශපාලන අනාගතයක් නැතැයි ද තිස්ස අත්තනායක මහතා සඳහන් කළේය.

# මිනිස් ජාවාරම්වලට සම්බන්ධ පුද්ගලයන්ට තරාතිරම නොබලා දඬුවම් දෙනවා

**- කම්කරු සහ විදේශ රැකියා ඇමති මනූෂ නානායක්කාර**

ප්‍රභාත් විතාන

මිනිස් ජාවාරම්වලට සම්බන්ධ පුද්ගලයන් සොයා දීප ව්‍යාප්ත වශයෙන් වැටලීම් සිදු කිරීමටත්, මිනිස් ජාවාරම් සහ මිනිස් වෙළෙඳාමට සම්බන්ධ පුද්ගලයන්ට තරාතිරම නොබලා දඬුවම් කිරීමටත්, කම්කරු සහ විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර සහ මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් යන මහත්වරු පොලිස් දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ, ආගමන විගමන දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් සමග ඉකුත් 16 දා පැවති විශේෂ සාකච්ඡාවකදී තීරණය කර ඇත.





මිනිස් ජාවාරම්වලට සම්බන්ධ පුද්ගලයන්ට එරෙහිව ගන්නා පියවරයන්හි ප්‍රගතිය සම්බන්ධයෙන් සෑම සති දෙකකට වරක්ම නිලධාරි මට්ටමේ ප්‍රගති සමාලෝචනයක් පැවැත්වීමටත් මෙහිදී තීරණය කර තිබේ.

දේශීය හා විදේශීය වශයෙන් මිනිස් ජාවාරම්වලට සම්බන්ධ ශ්‍රී ලාංකිකයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට මේ වනවිට ලැබී ඇති තොරතුරු මත වැටලීම් අඛණ්ඩව සිදු කරමින් පවතින අතර මේ අනුව එම වැටලීම් වඩාත් වේගවත් කිරීමටද නියමිතව ඇත.

මේ අතර මිනිස් ජාවාරම් සහ මිනිස් වෙළෙඳාම සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමටද මෙහිදී වැඩිදුරටත් තීරණය කර තිබේ.

මෙම සාකච්ඡාව සඳහා පොලිස්පති සී. ඩී. වික්‍රමරත්න මහතා ඇතුළු ඉහළ පොලිස් නිලධාරීන්, ආගමන විගමන දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ඉහළ නිලධාරීන් එක්ව සිටියේය.

# දිවුලපිටිය ප්‍රා. සභා අයවැය සම්මතයි

දිවුලපිටිය අයි. එම්. අබේරත්න

දිවුලපිටිය ප්‍රාදේශීය සභා 2023 අයවැය වාර්තාව පිළිබඳ පැවති ඡන්ද විමසීමේදී වැඩි ඡන්ද 31 කින් එම අයවැය වාර්තාව ජයග්‍රහණය කරවීමට ආණ්ඩු පක්ෂය සමත් විය.

2023 ප්‍රාදේශීය සභා අයවැයට පක්ෂව ඡන්ද 35 ක් ලැබුණු අතර විපක්ෂව ලැබුණේ ඡන්ද 04 ක් පමණි. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු තිදෙනා හා ස්වාධීන මන්ත්‍රීවරයා අයවැයට විපක්ෂව ඡන්දය පාවිච්චි කළේය.

ශ්‍රී ලංකා පොදු පෙරමුණේ මන්ත්‍රීවරුන් හා එක්ව එජාප මන්ත්‍රීවරුන්ද, ශ්‍රීලනිප මන්ත්‍රීවරුන්ද අයවැයට පක්ෂව ඡන්දය පාවිච්චි කිරීම විශේෂත්වයකි.

එජාප එක් මන්ත්‍රීවරියක ඡන්දය පාවිච්චි කිරීමෙන් වැළකී සිටියාය. මන්ත්‍රීවරුන් පස්දෙනකු පැමිණ සිටියේ නැත.

දිවුලපිටිය ප්‍රා. සභා සභාපති ඉන්දික ජයසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේදී අයවැය විවාදය පිළිබඳ ඡන්ද විමසීම පැවැත්විණි.

# හෝමාගම ජංගම සේවය අද ජල්තර දී

ඇන්ටන් ප්‍රනාන්දු

හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සංවිධානය කරන ජංගම සේවයක් අද (19 දා) ජල්තර දම්සෙත් මහ විදුහලේදී පෙරවරු 9 සිට පස්වරු 4 දක්වා පැවැත්වේ.

මෙහිදී වැඩිහිටි හැඳුනුම්පත්, ජාතික හැඳුනුම්පත්, දේශීය විදේශීය රැකියා අවස්ථා ලබා ගැනීම ඇතුළු මහජන සේවා රැසක් ලබාගත හැකි බව සංවිධායකයෝ පවසති. හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ජල්තර, හේන්පිටගෙදර ප්‍රජා සංවිධාන එක්ව මෙම කටයුතු සංවිධානය කර තිබේ.

# බියගම ආසනයේ ඇතැම් පාසල්වල අධ්‍යාපන මට්ටම දුර්වලයි

## සමහර දරුවන්ට නමවත් ලියා ගන්න බැහැ

## ආර්ථික දුෂ්කරතාවන් ද මෙහිදී බලපනවා

### - ප්‍රා. සභා මන්ත්‍රිනී චන්ද්‍රානි විජේසිරි

බියන්විල - ඒ. ඩබ්. රංජිත්

බියගම පාසල් පද්ධතියේ පාසල් කීපයකම අධ්‍යාපන මට්ටම ඉතාම දුර්වල බවත් නමවත් ලියා ගන්න බැරි දරුවන් සිටින බවත්. එබඳු ළමයි 50කට අධික සංඛ්‍යාවකට අධ්‍යාපනයට අවශ්‍ය පොත්පත්, පෑන්, පැන්සල්, පාසල් බෑග්, ඇඳුම්, ආහාර ආදී අවශ්‍ය ද්‍රව්‍ය ද ලබාදීමට තමන් සූදානම් බව චන්ද්‍රා විජේසිරි බියගම ප්‍රා. සභා මන්ත්‍රිනී සඳහන් කළාය.

මම මේ සභාවෙන් ලැබෙන මුදල් දීමනාව මගේ ප්‍රයෝජනයට ගත්තේම නැහැ. එම මුදල්වලින් පාසල් දරුවන්ට මෙන්ම ජීවන දුෂ්කරතාව තදින්ම ඇති නිවැසියන් තෝරාගෙන වියළි ආහාර පාර්සල් දීම වැනි කටයුතු ඉටු කරන බවත් චන්ද්‍රානි විජේසිරි මහත්මිය 'දිවයින'ට පැහැදිලි කළාය.

මන්ත්‍රීවරිය මෙවැනි සමාජ සත්කාරයක් ඉටුකරන බව දැනගන්නට ලැබුණු අවස්ථාවේ ඒ ගැන විමසූ විට එය සම්පූර්ණ සත්‍යයක් බවත් ප්‍රාදේශීය සභා නියෝජිතයින් කිහිපදෙනෙක්ම මගේ සමාජ සත්කාර ප්‍රදාන අවස්ථාවලට එක්ව ඇති බව ද පැහැදිලි කළාය.

# 'මනුසත් අභිමනෙන්' තිස්සමහාරාමයට සමාජ සත්කාරක සේවා රැසක්

දෙබරවැව
ඒ. ඒ. පේමසිරි

මනුසත් අභිමන සමාජ සත්කාරක පදනමේ තවත් ව්‍යාපෘතියක් තිස්සමහාරාම බෝගහපැලැස්ස ඔසුවින්න කනිෂ්ඨ විද්‍යාලයේදී පසුගියදා සිදුවිය. ලේ දන්දීමේ වැඩසටහනක්, පුස්තකාල පොත් ප්‍රදානයක්, රුක් රෝපණ වැඩසටහනක් හා පාසල් දරුවන්ට රංග කලා හා අංගම් පුහුණු වැඩසටහනක් පැවැත්වුණු බව එහි නියමු ප්‍රියදර්ශන රුද්‍රිගු පැවසීය. සුමුදු අමල්ක, ගයාන් මහගලගේ, අස්විද ගිම්හාන, කුමුදු කුමාරසේන යන කලාකරුවන් ද ධර්මදාස ප්‍රනාන්දු, ප්‍රදීප් තුෂාර හා රංගිකා රුද්‍රිගු ද එම කටයුතු සඳහා සහාය වී තිබේ.









# ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුරක්ෂා මානව සම්පත් මධ්‍යස්ථානයක්

ගම්පහ සමූහ - සුසිල් රණමුක



ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරගොඩ සුරක්ෂා මානව සම්පත් මධ්‍යස්ථානයේ පිහිටවූ නව බතික් පුහුණු මධ්‍යස්ථානය විවෘත කිරීම පසුගියදා ගම්පහ ප්‍රාදේශීය ලේකම් සුරංගා ගුණතිලක මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කෙරෙන බතික් පුහුණු මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ මෙය ආරම්භ කරන ලදී.

මෙම වැඩසටහනේ පළමු කණ්ඩායම ලෙස පුහුණුලාභීන් 25 ක් තෝරාගෙන ඇති අතර, පුහුණු කාලය මාස 03 කි. ඔවුන් සඳහා බතික් හා මෝස්තර නිර්මාණකරණය, මහන මැෂින් නඩත්තුව පිළිබඳ පුහුණුව ලබා දෙනු ඇත. මේ සඳහා මූල්‍ය දායකත්වය සපයන්නේ කර්මාන්ත අමාත්‍යාංශයේ පේෂකර්ම හා අත්‍යන්ත්‍ර නිෂ්පාදන ප්‍රවර්ධන අංශය මගිනි.

මේ සඳහා තාක්ෂණික සහාය ශ්‍රී ලංකා ඇඟලුම් හා පේෂකර්ම ආයතනය (SLITA) ලබාදී ඇති අතර, ව්‍යවසායක බලගැන්වීම ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) මගින් සිදු කර ඇත.

මේ අවස්ථාවට සුරක්ෂා මානව සම්පත් පුහුණු මධ්‍යස්ථානයේ කළමනාකරු වජිර අන්දර, දිස්ත්‍රික් ව්‍යවසාය සංවර්ධන නිලධාරී අශෝකා කුමාරි, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යවසාය සංවර්ධන නිලධාරී වසන්ති සේනාසිංහ, බතික් පුහුණු උපදේශිකා ගයනා නිල්මිණී යන මහත්ම, මහත්මීන්හු එක්ව සිටියහ.

## ප්‍රථම ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ලේඛකාධිකාරී හිමිවරුන්ගේ සම්මේලනය 26 දා

ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු විධිමත් හා කාර්යක්ෂම කිරීමේ අරමුණින් දිවයිනම ආවරණය වන පරිදි පිහිටුවා ඇති ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයන්හි ලේඛකාධිකාරී හිමිවරුන්ගේ ප්‍රථම වාර්ෂික සම්මේලනය ලබන 26 වැනි සෙනසුරුදා පෙ.ව. 8.00 සිට දවස පුරා මාතලේ Grand Mountain Hotel පරිශ්‍රයේදී පැවැත්වීමට කටයුතු කර ඇති බව ප්‍රධාන ලේඛකාධිකාරී මුගුණවෙල අනුරුද්ධ හිමියන් පැවසූහ.

# අංගසම්පූර්ණ ජාතික රෝහලක් බියගම පිහිටුවනවා

### බියගම ප්‍රාදේශීය සභා සභාපති ආනන්ද ගනේපොල

බියන්විල - ඒ. ඩබ්. රංජිත්

බියගම ආයෝජන කලාප පරිශ්‍රය තුළ අංගසම්පූර්ණ ජාතික රෝහලක් පිහිටුවීම සඳහා අවශ්‍ය භූමිය දෙපාර්තමේන්තු අනුමැතිය රජයේ විශේෂ අවධානය පාරිසරික යෝග්‍යතාව ඇතුළු මූලික ක්‍රියාදාමයන් ඉටු කර ඇති බව සභාපති ආනන්ද ගනේපොළ මහතා පැහැදිලි කළේය.

සභාපතිවරයා මෙම කරුණු පැහැදිලි කරනු ලැබුවේ ප්‍රා. ස. මන්ත්‍රී සමන්ත විජේරත්න මහතා විමසීම් කළ අවස්ථාවේදී මෙහිදී මන්ත්‍රී සමන්ත විජේරත්න මහතා කියා සිටියේ මේ දිනවල විදුලිය භාවිතයේදී අනුග මනය කළ යුතු අත්‍යවශ්‍ය කරුණක් වන්නේ මාර්ග විදුලි පහන් දැල්වීම ගැනය. සමහරු සවස 4ටත් පෙර මාර්ග විදුලි කණුවල විදුලි පහන් දල්වනවා. පසුදින උදේ 8 වනවිටත් නිවා දමන්නැති තැන් බොහොමයක් තිබෙනවා. අධික වර්ෂාවත් සමග කුඩා අනුකුඩා පාරවල් බොහොමයක පයින් යන්නවත් බැරි තරමට අබලි වෙලා ඒ ගැන සියලු කාර්ය මණ්ඩල අවධානය යොමු කරවන්නැයි ඉල්ලා සිටිනවා යැයි ප්‍රාදේශීය සභා රැස්වීමේදී පැහැදිලි කළේය.

# ඩුබායි යවන මුවාවෙන් ලක්ෂ ගණන් මුදල් ගැරූ අඹු සැමි යුවළක් දෙමටගොඩදී මාට්ටු

ගම්පහ සමූහ - සුසිල් රණමුක

ඩුබායි රැකියා ලබා දෙන මුවාවෙන් රුපියල් ලක්ෂ ගණනින් මුදල් වංචා කළ බව කියන අඹු සැමි යුවළක් යක්කල පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන ඇත.

මෙම යුවළ දෙමටගොඩ ප්‍රදේශයේ කුලී නිවසක රැඳී සිටියදී අත්අඩංගුවට ගත් බව පොලිසිය සඳහන් කරයි.

30 හැවිරිදි වියේ පසු වන මෙම අඹු සැමි යුවළ යක්කල සහ ගම්පහ ප්‍රදේශවල පුද්ගලයන් රවටා ලක්ෂ ගණන් මුදල් ලබා ගත් බවට පැමිණිලි 9 ක් යක්කල පොලිසියට ලැබී ඇතැයි පොලිසියට සඳහන් කරයි.

සැකකාර මෙම අඹු සැමි යුවළ විවිධ ප්‍රදේශවල කුලී පදනම මත ලබා ගත් නිවෙස්වල සුඛෝපභෝගී ජීවිත ගත කරමින් මෙලෙස ඩුබායි වෙත යවන බව පවසා මුදල් වංචාකොට ඇති බව පොලිස් පරීක්ෂණවලදී අනාවරණය කරගෙන ඇත.

# නුගේගොඩ ශාන්ත ජෝන් විදුහලේ අලුත්වැඩියා කරන ලද බුදුමැඳුර විවෘත කෙරේ

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන්




නුගේගොඩ සාන්ත ජෝන් විදුහල් ප්‍රාථමික අංශයේ අලුත්වැඩියා කරනලද බුද්ධ මන්දිරය සඳහා බුදුරැස් වළල්ලක් පරිත්‍යාගකර එහි ආලෝකය දල්වා විවෘත කිරීමේ පිංකමක් පසුගියදා පැවැත්විණි. එම අවස්ථාව සඳහා නුගේගොඩ නාලන්දාරාමාධිපති පූජ්‍යපාද තිනියාවල පාලිත හිමිපාණන් ඇතුළු මහා සංඝරත්නය වැඩම කළහ. මෙම බුද්ධ මන්දිරය සඳහා තීන්ත ආලේපන, බුදුරැස් වළල්ල පරිත්‍යාග කරනු ලැබුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ සම්බන්ධීකරණ ලේකම් තුෂාර සංජීව පෙරේරා මහතා විසිනි. ඒ මහතාගේ සොයුරියගේ ඉසුරු පුතනුවන් මීට වසර 9කට උඩදී හදිසි රිය අනතුරකින් මිය යෑම වෙනුවෙන් ඔහුට පිං පිණිස මෙය පරිත්‍යාග කර තිබේ. මෙම බුද්ධ මන්දිරය 2011 අගෝස්තු 3 වැනිදා විවෘත කර ඇත. එවකට සිටි දෙමාපියන්, ආදි සිසුන් එක්ව මෙය මාස 2 ක් ඇතුළත ඉදිකර තිබේ. ප්‍රාථමික අංශ නියෝජ්‍ය විදුහල්පතිනී එම්. පී. කේ. ජයලත් මහත්මියගේ උපදෙස් මත ආචාර්ය මණ්ඩලය දෙමාපියන් සිසු දරුවන් එක්ව මෙය සංවිධානය කර තිබිණි.

# මුරුංගාගස්යායේ ඥානිස්සර නාහිමි අනුස්මරණ අධ්‍යාපන ආයතනය විවෘත කිරීම හෙට

අපවත් වී වදාළ ප්‍රංශයේ ජේතවනාරාමාධිපති හා ප්‍රංශයේ අධිකරණ හා සංඝනායක ආචාර්ය මුරුංගාගස්යායේ ඥානිස්සර නාහිමිපාණන්ගේ සමාජ, අධ්‍යාපන හා ශාස්ත්‍රීය සේවාව ඉදිරියට පවත්වාගෙන යෑමේ අරමුණින් තංගල්ල, විතාරන්දෙණියේ, මුලනේ ඉදිකළ මුරුංගාගස්යායේ ඥානිස්සර නාහිමි අනුස්මරණ අධ්‍යාපන ආයතනය හෙට (20 දා) සවස 2.00 ට විවෘත කෙරේ.

මෙම භූමියේ ඉදිකළ නාහිමිපාණන්ගේ පිළිරුව ද මෙදින නිරාවරණය කෙරේ. ඥානිස්සර නාහිමිපාණන්ගේ ශිෂ්‍ය ප්‍රංශයේ ජේතවනාරාමයේ වැඩවසන ශාස්ත්‍රපති මුලනේ ගුණානන්ද හිමිපාණන්ගේ ධන පරිත්‍යාගයෙන් ඉදිකළ මෙම අධ්‍යාපන ආයතනය විවෘත කිරීමේ උත්සවයේ මුලසුන රුහුණු විශ්වවිද්‍යාලයේ කුලපති අකුරැටියේ නන්ද නාහිමියෝ හොබවති.

## 'ශාසන දීපනී' ශාස්ත්‍රීය සංග්‍රහය අද ප්‍රංශයේදී එළිදැක්වේ



ප්‍රංශයේ ජේතවනාරාමාධිපති හා ප්‍රංශයේ ප්‍රධාන අධිකරණ සංඝනායක අපවත් වී වදාළ ආචාර්ය මුරුංගාගස්යායේ ඤාණිස්සර නාහිමියන්ගේ ධර්ම ශාස්ත්‍රීය හා සමාජ මෙහෙවර අගයමින් සංස්කරණය කළ 'ශාසන දීපනී' ශාස්ත්‍රීය සංග්‍රහය අද (19 වැනිදා) ප්‍රංශයේ ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ දී එළිදැක්වේ. ශ්‍රී ලංකා පැරිස් බෞද්ධ විහාරාධිපති සාහිත්‍යශූරී කොන්ගස්දෙනියේ ආනන්ද නාහිමියෝ මුලසුන හොබවන මෙම උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපතිනි මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම මහත්මිය සහභාගි වේ. ප්‍රංශයේ ප්‍රධාන සංඝනායක, ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානාධිපති පරවාහැර චන්දරතන නාහිමි සංවිධානය කරන මෙම උත්සවයට ප්‍රංශයෙහි වැඩවසන මහා සංඝරත්නය, වියට්නාම ලාඕස්, කාම්බෝජ, චීන, ලාංකිකයෝ ඇතුළු විවිධ ජාතිකයන් සහභාගි වෙති.

මහාචාර්ය වාච්චේ ධම්මරක්ඛිත හිමි, කිරින්දේ පේමසිරි හිමි හා මහාචාර්ය නිලන්ත පී. දිසානායක මෙම ශාස්ත්‍රීය සංග්‍රහය සංස්කරණය කර ඇත.

## ස්වේච්ඡා සංවිධානයන්ට ආධාර පිණිස කොළඹ සංගීත ප්‍රසංගය හෙට


ගම්පහ සමූහ - සුසිල් රණමුක

රජයේ ලියාපදිංචි ස්වේච්ඡා සංවිධානයන්හි කටයුතු සඳහා ආධාර ලබාදීම පිණිස සංගීත ප්‍රසංග වැඩසටහනක් පැවැත්වීමට ''ටු ගෙදර් වී හෙල්ප්'' සංවිධානය පියවර ගෙන ඇත.

මෙහි පළමුවැනි වැඩසටහන එස්.ඕ.එස්. ළමා ගම්මාන වෙනුවෙන් ආධාර ලබාදීම පිණිස කොළඹ 03, බිෂොප් ශ්‍රවණාගාරයේදී හෙට (20 දා) සවස 7 ට පැවැත්වීමටත් ඉන් අනතුරුව කොළඹ තරුණ බෞද්ධ සමිතියට ආධාර වෙනුවෙන් පැවැත්වීමටත් ''ටූ ගෙදර් වී හෙල්ප්'' සංවිධානය කටයුතු යොදා ඇති බව එම සංවිධානයේ වැඩසටහන් ප්‍රධානී ප්‍රසන්න අලුත්ගේ මහතා පැවසීය.

පළමු වැනි ප්‍රසංග සඳහා ප්‍රවීණ ගායන ශිල්පීන් වන ටී. එම්. ජයරත්න සහ රෝහණ බෝගොඩ යන මහත්වරුන් 70/80 දශකයේ ගීත ඉදිරිපත් කරමින් එක්වන බවත් මෙහි සංගීතය සැපයීම ''සැක්සෆෝන් සංගීත කණ්ඩායම'' විසින් ඉදිරිපත් කරන බවත් මෙම අවස්ථාවට සහභාගි වූ ප්‍රවීණ සංගීතඥ අර්නස්ට් සොයිසා මහතා කීය. සංජී වීරසිංහ මහත්මිය වැඩසටහන සම්බන්ධීකරණය කරන්නීය.

## බෙම්පියා



# ඔබේ දෛවය

යක්කල වීරවංශ පතිරණ

## රාහු කාලය

**අද රාහු කාලය - 9.02 සිට 10.32 දක්වා**

**හෙට රාහු කාලය - 4.32 සිට 6.02 දක්වා**

**මේෂ-**

තරමක් ක්‍රියාශීලී දිනකි. සමාජ සත්කාරක ක්‍රියාවන්වල යෙදේ. ආගමික වතාවත් ගරු කරන දිනකි. තරමක් තෘප්තිමත්ව ක්‍රියා කරයි. ඥාති මිත්‍රාදීන්ගේ සුහඳතා වර්ධනය වෙන දිනකි. සිරසගත රෝගද මතුකරයි.

**ශුභ වර්ණය තද රෝස, ජය අංකය 05**

**වෘෂභ-**

දහමට ලැදිව ක්‍රියාකරයි. තම ඥාති මිත්‍රාදීන් ඒකරාශීව ක්‍රියාකරයි. ගමන් බිමන්ද යෙදේ. විනෝදජනක ක්‍රියාවන්වල යෙදේ. තරමක් මිල මුදල් වැයවන අතර හදිසි ලාභද ලබයි. ස්නායුගත රෝග මතුකරයි.

**ශුභ වර්ණය තද සුදු, ජය අංකය 03**

**මිථුන-**

විනෝද ජනක ක්‍රියාවන්වල යෙදෙන මිත්‍ර සබඳතා වර්ධනය වන දිනකි. උත්සව සාද යෙදේ. නවක මිතුදම් ඇතිවෙයි. දහමටද ලැදිව ක්‍රියා කරයි. භූමි ලාභ සම්පත් ලබයි. අම්ල පිත්ත රෝග මතුකරයි.

**ශුභ වර්ණය කොළ, ජය අංකය 06**

**කටක-**

කාර්ය බහුල දිනකි. තම ඥාති මිත්‍රාදීන් ඒකරාශීව ක්‍රියාකරයි. තම පදිංචි ස්ථානය උත්සව ශ්‍රියාවක් ගෙනදෙයි. දහමටද ලැදිව ක්‍රියාකරයි. සුළුවෙන් හෝ හදිසි ධන ලාභද ගෙනදෙයි. සෙම් බහුල රෝග මතුකරයි.

**ශුභ වර්ණය තද කහ, ජය අංකය 04**

**සිංහ-**

සුපුරුදු ක්‍රියාකාරකම්වලින් බැහැරව දහමට යොමුව ක්‍රියාකරයි. දාන ශීලාදී කර්මවල යෙදේ. පොදු සේවා ක්‍රියාකාරකම්වලද යෙදේ. විනෝද ජනක කටයුතුවලද යෙදෙන අතර වැයපස ඉහළයි. මුත්‍රා ආසාදන මතුවේ.

**ශුභ වර්ණය තැඹිලි, ජය අංකය 01**

**කන්‍යා-**

ආධ්‍යාත්මික ගුණ වගාවන් කෙරෙහි සිත් යොමු කරයි. තම ඥාති මිත්‍රාදීන් එක්ව ක්‍රියාකරයි. නිවස උත්සව ශ්‍රියාවක් ඇති කරයි. ප්‍රේම සබඳතා වර්ධනය වෙයි. හදිසි ධන ලාභ ලැබීම් ඇතිවේ. උෂ්ණ රෝග මතුකරයි.

**ශුභ වර්ණය රන්වන්, ජය අංකය 09**

**තුලා-**

විවේකීව දවස ගෙවයි. දාන මානාදී කුසල කර්මවලද යෙදේ. ප්‍රීති සාද වැනි දේවලටද සහභාගිවීමේ අවස්ථා යෙදේ. සිත් චංචල කරවන කරුණු ද යෙදේ. අමතර ලාභ ලබයි. කැපුම් කෙටුම් වැනි හදිසි රෝග වලට හේතුයි.

**ශුභ වර්ණය දුඹුරු, ජය අංකය 07**

**වෘශ්චික-**

තම ඥාති මිත්‍රාදීන් ඒකරාශීව ක්‍රියාකරයි. ආගමික වතාවත් ගරු කරයි. විනෝදජනක ක්‍රියාවන්හිද යෙදේ. ප්‍රීති සාදවලට සහභාගි වෙයි. නවක මිතුදම් ඇතිවෙයි. වැයපස ඉහළයි. මුඛ අර්ශස් රෝග මතුකරයි.

**ශුභ වර්ණය රතු, ජය අංකය 08**

**ධනු-**

සුපුරුදු ක්‍රියාවන්ගෙන්, රාජකාරි ආදියෙන් දුරස්වී දවස ගෙවයි. අධ්‍යාත්මික ගුණවගාවන් කෙරෙහි මූලිකව ක්‍රියාකරයි. ප්‍රීතිසාද උත්සව ආදියෙහිද යෙදෙන හදිසි ලාභද ලබන දිනකි. ස්නායුගත රෝග වේදනා මතුවේ.

**ශුභ වර්ණය ලා රෝස, ජය අංකය 01**

**මකර-**

ශුභා ශුභ ඵලදෙයි. ආගමික වතාවත් පුද පූජා වැනි දේවල මූලිකව ක්‍රියාකරයි. මහජන ප්‍රසාදය දිනාගනී. විනෝදජනක ක්‍රියාවන්හිද යෙදෙන අතර විනෝද ක්‍රියාවන්හිද යෙදේ. ආමාශ ගත රෝග මතුවේ.

**ශුභ වර්ණය නිල්, ජය අංකය 02**

**කුම්භ-**

ධර්මානුකූලව දවස ගෙවයි. දාන මානාදී ආදී පුණ්‍ය කටයුතුවල යෙදේ. විනෝද ක්‍රියා ගමන් ආදියද යෙදේ. කෙසේ නමුත් මිල මුදල් තරමක් වැයවන දිනකි. වාද විවාද සුදුසු නොවේ. හන්දි රෝග, ඉදිමුම් රෝග මතුකරයි.

ශුභ වර්ණය - දම්, ජය අංකය - 05

**මීන -**

සුපුරුදු ක්‍රියාවන්ගෙන් දුරස්ථව දහමට ලැදිව දවස ගෙවයි. පුද පූජා උත්සව වැනි දේවල මූලිකව ක්‍රියාකරයි. ඇසුරු කරන්නන් අතර ප්‍රසාදයට පත්වේ. ප්‍රීති සාදවලට සහභාගි වේ. අක්ෂි රෝග මුඛ රෝග මතුකරයි.

**ශුභ වර්ණය කහ, ජය අංකය 09**



2022 නොවැම්බර් මස 19 වැනිදා සෙනසුරාදා

# දිවයින ක්‍රීඩා






# පාපන්දු ලෝක කුසලානය කටාර් රාජ්‍යයේදී

## තරගාවලිය හෙට සිට ඇරඹේ

ලොව විශාලතම ප්‍රේක්ෂක පිරිසකට හිමිකම් කියන අසිරිමත්ම ක්‍රීඩා සැණකෙළිය වන පාපන්දු ලෝක කුසලාන තරගාවලිය කටාර් රාජ්‍යයේදී හෙට (20 වැනිදා) සිට ආරම්භ වේ.

පාපන්දු ලෝක කුසලානයේ 22 වැනි අදියර මෙලෙස කටාර් රාජ්‍යයේදී පැවැත්වේ. දින 29ක් පුරා පැවැත්වෙන මෙම තරගාවලිය එළඹෙන දෙසැම්බර් මස 18වැනිදා දක්වා පැවැත්වේ.

2002 වසරේ දකුණු කොරියාවේ සහ ජපානයේ පැවති තරගාවලියෙන් පසුව ආසියාවේ පැවැත්වෙන පළමු පාපන්දු කුසලාන තරගාවලිය මෙය වේ. එමෙන්ම අරාබිකරයේ එතෙක් මෙතෙක් පැවැත්වෙන පළමු පාපන්දු කුසලානය මෙය වේ.

මෙවර කුසලානයද අතිශය තරගකාරී වනු ඇති බව නොඅනුමානය. පාපන්දුවේ වර්තමාන ශූරයන් වන ප්‍රංශය සිය කිරුළ රැකගැනීමට සැරසෙද්දී, වැඩිම වරක් කුසලානය හිමිකර ගෙන ඇති බ්‍රසීලය මෙන්ම ආර්ජන්ටිනාව මෙවර තරගාවලියේ වැඩි ආකර්ෂණයක් දිනාගෙන සිටියි.

# ටැමිල් යුනියන් කණ්ඩායමෙන් දැවැන්ත ලකුණු පුවරුවක්

## සීසීසී ලකුණු 500ක් පිටුපසින්



මේජර් ලීග් ක්‍රිකට් තරගාවලියේ අවසන් මහා තරගයේ පළමුව පන්දුවට පහර දුන් ටැමිල් යුනියන් කණ්ඩායම සිය පළමු ඉනිම සඳහා කොළඹ ක්‍රිකට් සමාජය (සීසීසී)ට එරෙහිව ලකුණු 558ක දැවැන්ත ලකුණු පුවරුවක් නිර්මාණය කිරීමට ඊයේ (18 වැනිදා) සමත්ව සිටියේය.

පිළිතුරු ඉනිම ක්‍රීඩා කරන සීසීසී කණ්ඩායම ඊයේ සවස හතර පමණ වනවිට පන්දු වාර 13ක් තුළ එක් කඩුල්ලක් දැවී ලකුණු 58ක් ලබා ගෙන සිටියේය. ඒ අනුව ටැමිල් යුනියන් කණ්ඩායම සීසීසී කණ්ඩායමට වඩා ලකුණු 500ක් ඉදිරියෙන් සිටියේය.

නායක සධීර සමරවික්‍රම ලබාගත් ලකුණු 188 ක විශාල ඉනිමෙන් ශක්තිමත් වූ ටැමිල් යුනියන් ඉනිමේ අවසාන භාගය වේගවත් අර්ධ ශතකයකින් පෝෂණය කිරීමට තුන් ඉරියව් ක්‍රීඩක ඉසුරු උදාන සමත් වූයේය.

පන්දු 72කදී හයේ පහර 3ක් සහ හතරේ පහර 8ක් සමගින් ලකුණු 88ක් ලබා ගැනීමට සමත් වූ ඉසුරු උදාන විශ්ව ප්‍රනාන්දුගේ පන්දුවක් හමුවේ දැවී ගියේය. විශ්ව ප්‍රනාන්දු එම කඩුල්ලත් සමගින් තවත් කඩුලු 3ක් දවාගත් අතර ඒ අතර නායක සමරවික්‍රමගේ කඩුල්ල ද, ආරම්භක පිතිකරු නවෝද් පරණවිතානගේ කඩුල්ල ද විය. විශ්ව ප්‍රනාන්දුට පසුව සීසීසී කණ්ඩායම වෙනුවෙන් කඩුලු 4ක් දවා ගැනීමට දඟ පන්දු යවන ක්‍රීඩක ලක්ෂාන් සඳකැන් ද සමත් වූයේය.

සීසීසී කණ්ඩායමේ අවසන් පිතිකරුවා ලෙස කවිඳු පතිරත්න දවා ගැනීමට ද ලක්ෂාන් සඳකැන් සමත් වූ අතර ඒ වන විට ඔහු අර්ධ ශතකයට ලකුණු හතරක් මෙපිටින් සිටියේය. මාලින්ද පුෂ්පකුමාර සහ චමිඳු විජේසිංහ එක් කඩුල්ල බැගින් දවා ගත්හ. අද (19 වැනිදා) තරගයේ තෙවැනි දිනයයි.

# දැල්පන්දු කළමනාකාරිනි අනුෂාට ආදි මහාබෝධියෙන් ප්‍රණාම




ආසියානු කාන්තා දැල්පන්දු ශූරතාවය දිනාගත් ශ්‍රී ලංකා කණ්ඩායමේ කළමනාකාරිනි ක්‍රීඩා නිලධාරී අනූෂා මයුරනි මහත්මිය ක්‍රීඩා ක්ෂේත්‍රයට කළ සේවය අගයනු වස් ආදි මහාබෝධියන්ගේ ක්‍රීඩා සමාජය විසින් සියලුම ක්‍රීඩා සමාජ වෙනුවෙන් ගෞරව ප්‍රණාම දක්වන ලදී. එම ගෞරව සම්මානය කොළඹ දිසාපති ප්‍රදීප් යසරත්න මහතා විසින් ප්‍රදානය කෙරුණු අතර ඒ සඳහා කොළඹ ප්‍රාදේශීය ලේකම් නාලක රත්නායක මහතා ආදි මහාබෝධියන්ගෙ ක්‍රීඩා සමාජයේ සභාපති සුරත් ජයමාන්න මහතා ඇතුළු සාමාජිකයෝ සහභාගි වූහ.

# 18 න් පහළ හොකී තරගාවලියට අයැදුම්පත් කැඳවයි

ශ්‍රී ලංකා පාසල් හොකී සංගමය විසින් මෙහෙයවනු ලබන 'ශ්‍රී ලංකා පාසල් වයස අවුරුදු 18 න් පහළ බාලක සහ බාලිකා හොකී තරගාවලිය' ට අයැදුම්පත් භාර ගැනීම දැන් සිදු කෙරේ.

නොවැම්බර් මස 28,29,30 සහ දෙසැම්බර් 01 යන දිනවල මාතර උයන්වත්ත ක්‍රීඩාංගණය කේන්ද්‍ර කර ගනිමින් මෙවර තරග මාලාව පැවැත්වීමට සංවිධායකයන් වන ශ්‍රී ලංකා පාසල් හොකී සංගමය තීරණය කර තිබේ.

2005 ජනවාරි මස 01 දින සිට 2006 දෙසැම්බර් මස 31 දින දක්වා උපත ලබා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙවර තරගාවලියට සහභාගි විය හැකි බව ද පාසල් හොකී සංගමය නිවේදනය කර සිටී. 2005 සහ 2006 දෙවසර තුළ උපත ලබා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන් නොමැති පාසල් වෙත්නම් 2007 සහ 2008 යන වර්ෂයන්හි උපත ලබා ඇති ක්‍රීඩකයන් හෝ ක්‍රීඩිකාවන් 08 දෙනකු උපරිම වශයෙන් මෙවර කණ්ඩායමට ඇතුළත් කිරීමට අවස්ථාව ලබාදී තිබීම විශේෂත්වයකි.

සෑම ක්‍රීඩක ක්‍රීඩිකාවක්ම තම අනන්‍යතාව තහවුරු කිරීම උදෙසා උප්පැන්න සහතිකය සමග ශ්‍රී ලංකා පාසල් හොකී සංගමය විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත හෝ ජාතික හැඳුනුම්පත හෝ තැපැල් හැඳුනුම්පත හෝ විදේශ ගුවන් ගමන් බලපත්‍රය ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

සියලුම අයැදුම්පත් නොවැම්බර් මස 23 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි අනුරුද්ධ හේරත් බණ්ඩාර මහතා, ලේකම්, ශ්‍රී ලංකා පාසල් හොකී සංගමය, විජය විද්‍යාලය, මාතලේ යන ලිපිනයට යොමු කළ යුතුය.

# ශ්‍රී ලංකා බාලිකාවියන්ගේ පැතුම් සුන් වෙයි

## සිව්කොන් අවසන් සටන අද

සිව්කොන් තරගාවලියටක සහභාගි වීම සඳහා ඉන්දියාවට ගොස් සිටින වයස අවුරුදු 19 න් පහළ ශ්‍රී ලංකා බාලිකා කණ්ඩායම මූලික තරග වටය යටතේ සහභාගි වුණු තෙවැනි තරගයෙන් ඉන්දීය ඒ පිල හමුවේ පෙරේදා (17 වැනිදා) ලකුණු 77 ක පරාජයකට මුහුණ දුන්නේය. මෙම තරග පරාජයත් සමග අද (19 වැනිදා) පැවැත්වීමට නියමිත අවසන් මහ තරගයට සුදුසුකම් ලැබීම සඳහා තබා තිබූ බලාපොරොත්තු ද සුනු විසුණු විය.

විසාග්හි පැවැති මෙම තරගයේදී පළමුව පන්දුවට පහර දුන් ඉන්දීය 'ඒ' කණ්ඩායම නියමිත පන්දු වාර 20 අවසනදී කඩුල්ලක් පමණක් දැවී ලකුණු 175 ක් රැස් කිරීමට සමත්වූවේය. ඉන්දීය ඉනිම වෙනුවෙන් සාර්ථක පිතිහරඹයක නියැළුණු ආරම්භක පිතිකාරිණියෝ පළමු කඩුල්ල වෙනුවෙන් ලකුණු 116 ක් එක් කළේ පන්දු 82 ක් පමණක් වැය කරමිනි.

ඒ වෙනුවෙන් නායිකා සෙර්වාට් පන්දු 46 ක් තුළ හතරේ පහර 11 ක් සහ හයේ පහරක් සමග ලකුණු 68 ක් ලබා ගත්තාය.

ලකුණු 176 ක අභියෝගාත්මක ඉලක්කය හඹා යෑම සඳහා පිටියට පිවිසි ශ්‍රී ලංකා කණ්ඩායමට නියමිත පන්දු වාර 20 අවසනදී සියලු දෙනා දැවී ලබා ගැනීමට සමත්වූයේ ලකුණු 98 ක් පමණි.

එම තරගයේදී ද සාර්ථකත්වයට පත්වූ තුන් ඉරියව් ක්‍රීඩිකා මනුදි නානායක්කාර පන්දු 27 ක් තුළ වේගවත් ලකුණු 35 ක් ලබා ගත්තාය. ජාත්‍යන්තර අත්දැකීම් සහිත ශ්‍රී ලංකා පිලේ නායිකාව වන විශ්මි ගුණරත්න අද තරගයේදීත් ලකුණු 18 කට දැවී ගිය නමුත් නවක ක්‍රීඩිකාවක් වූ මනුදි නානායක්කාර සමස්ත තරගාවලියේදීම කැපී පෙනෙන දස්කම් දැක්වූවාය.

ඉන්දියාව පන්දු වාර 20 කදී කඩුලු 1 ට ලකුණු 175 යි. - (ශ්වො සෙර්වාට් 68, සෞම්‍යා තිවාරි 65, සෝනියා මෙන්දියා (නොදැවී) 34, මනුදි නානායක්කාර 43/1)

ශ්‍රී ලංකාව පන්දු වාර 20 කදී කඩුලු9 ක් දැවී ලකුණු 98 යි - (මනුදි නානායක්කාර 35, විශ්මි ගුණරත්න 18, නෙත්මි සේනාරත්න 14, විහාරා සෙව්වන්දි 13, සෝනම් යාදව් 13/3, අර්චනා දේවි 16/3)

# මාබිම විද්‍යාකරයේ කබඩි ශූරයෝ....



ගම්පහ සමූහ - සුසිල් රණමුක

හොරණ මිල්ලනිය මහා විද්‍යාලයීය ක්‍රීඩාංගනයේ, පසුගියදා පැවැති 2022 වාර්ෂික බස්නාහිර පළාත් කබඩි ක්‍රීඩා තරගාවලියේදී ගම්පහ අධ්‍යාපන කොට්ඨාසය වෙනුවෙන් තරග වැදුණු වයස අවුරුදු 17 න් පහළ මාබිම විද්‍යාකර මහා විද්‍යාලයීය පිරිමි කබඩි කණ්ඩායම දිවයිනේ සුප්‍රසිද්ධ පාසල් ගණනාවක් පරදවා තෙවන ස්ථානය දිනාගනිමින් සමස්ත ලංකා අවසන් මහා වටයට සුදුසුකම් ලැබීය.

වසර ගණනාවකට පසු ගම්පහ දිස්ත්‍රික්කයේ කබඩි ක්‍රීඩාවට නව ජීවයක් ලබා දීමට සමත් වූ මාබිම විද්‍යාකර මහා විද්‍යාලයීය ක්‍රීඩා කණ්ඩායම සිය විදුහල්පති ඩබ්ලිව්. ඒ. විජිත ලක්ෂමන් විජේසූරිය, ක්‍රීඩා ආචාරිනි යමුනා හපුආරච්චි, ක්‍රීඩා විෂයභාර ගුරු උපදේශක ඩී. එම්. කීර්ති කුමාර හා ගම්පහ අධ්‍යාපන කොට්ඨාසයේ කබඩි ක්‍රීඩා උපදේශිකා ටී. එම්. ගීතා චාන්දනී ඇතුළු මහත්ම මහත්මීන්, ආචාර්ය මණ්ඩලය සමග එක්ව සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

ඉදිරිපස පෙළ :- (වමේ සිට දකුණට) කේ. එම්. චතුර දිල්ෂාන්, ඊ. ජී. ආර්. එස්. වීරතුංග, යුවන්ත ගිම්හාන කුමාර, ශිවන්ත හර්ෂණ, එච්. කේ. රණසිංහ, ආර්. එම්. ඒ. ජී. දුලාංජ මධුෂංඛ

පසුපෙළ:- එච්. ජී. හිමරු, ෂෙවාන්, එස්. ජී. පී. කල්හාර, කේ. ජී. ප්‍රවීන් තිසර, යූ. යූ. නිපුණ පියුමාල්, කේ. නිම්සර දිනෝක ද සිල්වා

උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් 2022 නොවැම්බර් මස 19 වැනිදා සෙනසුරාදා ප්‍රසිද්ධ කරන ලදී.